2010

වාර්ෂික වාර්තාව

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

2013-06-24

ගරු අබ්දුල් රිෂාඩ් බදියුදීන් මැතිතුමා,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය,
73/1,ගාලු පාර
කොළඹ 03.

ගරු ඇමතිතුමනි,

වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශය - 2010

1971 අංක 38 දරණ මුදල් පනතේ 13(2) වගන්තියේ විධිවිධාන ප්‍රකාර ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2010 වසර සඳහා වන වාර්ෂික වාර්තාව සහ පහත සඳහන් ලියකියවිලි ඔබ වෙත සතුටින් පිළිගන්වමි.

- **සභාපතිගේ වාර්තාව**
- **ගිණුම් ප්‍රකාශය**
- **විගණකාධිපතිගේ වාර්තාව**

මෙයට - විශ්වාසී

බන්දුල එගොඩගේ

සභාපති සහ ප්‍රධාන විධායක

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය 2010

සභාපති සහ ප්‍රධාන විධායක	-	අනිල් කොස්වත්ත මහතා (2010 මැයි මස දක්වා) ජනක රත්නායක මහතා (2010 මැයි 20 සිට)
විධායක අධ්‍යක්ෂ	-	යුසුෆ් මරික්කාර් මහතා
අධ්‍යක්ෂ ජෙනරාල්	-	ඩබ්ලිව් එම් ඩී එස් වීරකෝන් මිය
මූල්‍ය අංශය	-	එම් කේ පී මෙන්ඩිස් මහතා - අධ්‍යක්ෂ (2010 ජුලි 31 දක්වා) පී කේ සුමිත්‍රාරච්චි මහත්මිය - වැ.බ අධ්‍යක්ෂිකා (2010 අගෝස්තු 06 සිට)
මානව සම්පත් සංවර්ධන අංශය	-	කේ ඩබ් ආර් බී විජේරත්න මහතා අධ්‍යක්ෂ
සේවා අංශය	-	එම් කේ උදයපාල මහතා - අධ්‍යක්ෂ
ටේඩ්නෙට්එස්එල් අංශය	-	එස් එම් තිරිමාන්න මහත්මිය - අධ්‍යක්ෂිකා
අපනයන අලෙවි සංවර්ධන අංශය	-	ජේ.සිරිවර්ධන මිය - අධ්‍යක්ෂිකා
අපනයන කෘෂිකර්ම අංශය	-	එම් අයි සුෆියාන් - අධ්‍යක්ෂ
සුළු හා මධ්‍යම ව්‍යවසාය සංවර්ධන අංශය	-	ආර් එම් පී හේවාලියනගේ මෙනවිය අධ්‍යක්ෂිකා
ප්‍රතිපත්ති සහ සැලසුම් ප්‍රංශය	-	එස් ජේ සිල්වා මහතා - අධ්‍යක්ෂ
අභ්‍යන්තර විගණන අංශය	-	එච් එස් ප්‍රනාන්දු මහතා - ප්‍රධාන අභ්‍යන්තර විගණක
නීති අංශය	-	ඩී ටී විජේරත්න මහත්මිය - නීති නිලධාරිනී
විගණකවරු	-	විගණකාධිපති
බැංකුකරුවන්	-	ලංකා බැංකුව සම්පත් බැංකුව ජාතික සංවර්ධන බැංකුව

<u>**ලියාපදිංචි කාර්යාලය**</u>

අංක 42, නවම් මාවත,
කොළඹ 02.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් 2010

01	ජනක රත්නායක මහතා	-	සභාපති
02	යුසුෆ් මරික්කාර් මහතා	-	අධ්‍යක්ෂ
03	නවාස් රාජබ්දීන් මහතා	-	අධ්‍යක්ෂ
04	ෂරාෆ් එම් සුහයිබ් මහතා	-	අධ්‍යක්ෂ
05	සුමිත් විජේසිංහ මහතා	-	අධ්‍යක්ෂ
06	කේ පී අලවිදීන් මහතා	-	අධ්‍යක්ෂ
07	රොහාන්ත එන් ඒ අතුකෝරාළ මහතා	-	අධ්‍යක්ෂ
08	ඒ එම් ජයවික්‍රම මහතා	-	අතිරේක ලේකම් වරාය හා ගුවන් සේවා අමාත්‍යංශය
09	මැණිකේ චන්ද්‍රසිරි මහත්මිය	-	අතිරේක ලේකම් කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංය
10	එම් එච් මුයිනුදීන් මහතා	-	අතිරේක ලේකම් කෘෂිකර්ම අමාත්‍යාංශය
11	පී එල් යූ දිසානායක මහතා	-	අතිරේක ලේකම් වැවිලි කර්මාන්ත අමාත්‍යංශය
12	ආචාර්ය ඒ දමිතා එන් ද සොයිසා	-	ලේකම් ධීවර හා ජලජ සම්පත් අමාත්‍යංශය
13	ආචාර්ය නෙවිල් ගුණවර්ධන මහතා	-	අධ්‍යක්ෂක ජනරාල් වෙළඳ තීරුබදු සහ ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව මූල්‍ය හා ප්‍රතිපත්ති සම්පාදන අමාත්‍යංශය
14	බී පී ආර් උයන්ගොඩ මහතා	-	අතිරේක ලේකම් විදේශ කටයුතු අමාත්‍යංශය
15	වී සිවඥානසෝති මහතා	-	ලේකම් සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යංශය

පටුන

01	හැඳින්වීම	11
02	2010 වර්ෂයේ අපනයන කාර්ය සාධනය	12
03	2010-12-31 දිනට ශේෂ පත්‍රය	30
04	2010-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ප්‍රකාශය	31
05	මුදල් ප්‍රවාහ ප්‍රකාශය	33
06	විගණන වාර්තාව	34

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

2010 ජනවාරි - දෙසැම්බර්
ප්‍රගති වාර්තාව

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

1979 අංක 40 දරණ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, අපනයන සංවර්ධනය සහ ප්‍රවර්ධනයේ නියැලි ප්‍රධානතම රාජ්‍ය ආයතනයයි.

අපගේ ඉදිරි දැක්ම

අපගේ ප්‍රධාන අපනයන භාණ්ඩ හා සේවාවන් සඳහා අන්තර්ජාතික ගැණුම්කරුවන් අතර ප්‍රමුඛතම සැපයුම්කරු බවට ශ්‍රී ලංකාව පත් කිරීම.

අපගේ මෙහෙවර

භාණ්ඩ හා සේවා අපනයනය සංවර්ධනය හා ප්‍රවර්ධනය කිරීමේ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය බවට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය පත් කිරීම, ශ්‍රී ලංකාවේ අපනයනයන්ගේ ජාත්‍යන්තර තරගකාරීත්වය ඉහළ නැංවීම, භාණ්ඩ හා සේවා අපනයනයෙන් උපරිම විදේශ විනිමයක් උපයා ගැනීමට කටයුතු කිරීම සහ රජයේ සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට උපරිමව දායක වීම.

අපගේ අරමුණු

1. “මහින්ද චින්තන - ඉදිරි දැක්ම“ අපේක්ෂිත ආර්ථික සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට හැකිවන පරිදි ශ්‍රී ලංකාවේ අපනයන ආදායම වර්ෂ 2015 දී ඇ.ඩොලර් බිලියන 15 දක්වා ඉහළ නැංවීම.

2. යුරෝපා සංගමය සහ ඇමරිකා එක්සත් ජනපද වෙළඳපලවලට කරනු ලබන ශ්‍රී ලංකාවේ අපනයන ස්ථාවරව පවත්වා ගන්නා අතරතුර, අනිකුත් විදේශ වෙළඳපලවලට කරනු ලබන අපනයන, සමස්ථ අපනයන ඉපැයුමෙන් 50% ට වඩා වැඩි මට්ටමකට ඉහළ නැංවීම.

3. ශ්‍රී ලංකාවේ මුළු අපනයන ආදායමට 80% ක් පමණ දායක කරනු ලබන හඳුනාගත් ප්‍රමුඛ භාණ්ඩ හත (07) පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින්, ඒවායේ අපනයන ආදායම සැලකිය යුතු ලෙස වැඩි කිරීම.

4. ඒකාබද්ධ අලෙවි සන්නිවේදන වැඩ සටහනක් තුලින්, ශ්‍රී ලංකාවේ අපනයන භාණ්ඩ හා සේවා පිළිබඳව ධනාත්මක ප්‍රතිරූපයක් අන්තර්ජාතිකව ඇති කිරීම.

5. අපනයන වෙළඳාමේ ප්‍රතිලාභ, එම ක්ෂේත්‍රයේ නියැලි සියළු පාර්ශවයන්ටම සහ දිවයිනේ සෑම පළාතකටම ගලා යාමට සැලැස්වීම.

6. සේවක ඵලදායිතාව සහ කැපවීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින්, ආයතනයේ මූලික වටිනාකම් මත ගොනු වූ විශිෂ්ඨ කණ්ඩායමක් මණ්ඩලය තුළ බිහි කිරීම.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

2010 ජනවාරි - දෙසැම්බර් කාලය තුල ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය

ශ්‍රී ලංකාවේ භාණ්ඩ හා සේවා සංවර්ධනයේ සහ ප්‍රවර්ධනයේ නියැලි ප්‍රධාන රාජ්‍ය ආයතනය ලෙස, අපනයන සංවර්ධන වැඩ සටහන් රැසක් 2010 වසරේ ජනවාරි - දෙසැම්බර් කාලය තුලදී අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලදී. මෙම කාලය තුලදී ක්‍රියාත්මක කල, එම වැඩසටහන්වල ප්‍රධාන අරමුණු වූයේ අපනයනට හිතකර වෙළඳ පරිසරයක් ඇති කිරීම, අපනයන වෙළඳ පලට පිවිසීම සහ සංවර්ධනය කිරීම සඳහා අපනයනකරුවන්ට විශේෂිත වූ සේවාවන් සැපයීම, ගෝලීය වෙළඳපල අවශ්‍යතාවන්ට අනුකූලව අපනයන භාණ්ඩ හා සේවා සංවර්ධනයට අවශ්‍ය සහාය ලබාදීම සහ විශේෂයෙන්ම ප්‍රාදේශීය මට්ටමින් සුළු හා මධ්‍ය පරිමාණ අපනයනකරුවන් සංවර්ධන කිරීම යන ආදී වේ. මෙම වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේදී රජයේ සංවර්ධන අරමුණු වන 8% ක තිරසාර ආර්ථික වර්ධන වේගයක් පවත්වා ගැනීම, සේවා නියුක්ති අවස්ථා ඇති කිරීම, දිළිඳු කම පිටුදැකිම සහ ප්‍රාදේශීය විෂමතා අවම කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබීය.

2. 2010 ජනවාරි - දෙසැම්බර් කාලය තුල අපනයන ක්ෂේත්‍රයේ ප්‍රගතිය

2009 වසරේදී දැඩි පසුබෑමකට ලක් වූ ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂේත්‍රය, 2010 ජනවාරි - දෙසැම්බර් කාලය තුලදී පසුගිය වසරේ එම කාලයට සාපේක්ෂව, 20.98% ක දිරි ගන්නා සුළු වර්ධන වේගයක් වාර්තා කරනු ලැබීය.



කෘෂිකාර්මික, කාර්මික සහ ධීවර යන ප්‍රධාන අපනයන ක්ෂේත්‍රයන් තුනම මෙම කාලය තුලදී පිළිවෙලින් 25.31%, 20.1% සහ 12.86% ක ධන වර්ධන වේගයක් වාර්තා කරනු ලැබීය.

සමස්ථ අපනයන ආදායමට 25% ක් දායක කරනු ලබන කෘෂි ක්ෂේත්‍රය ඉහළම වර්ධනය වාර්තා කළ අතර ප්‍රධාන කෘෂි අපනයන වන තේ (21.4%), ස්වභාවික රබර් (75.8%), පොල් කෙඳි ආශ්‍රිත නිමැවුම් (13.15%), කුළුබඩු (66.08%) වල ඉහළ වර්ධන වේගය ඊට දායක විය.



මුළු අපනයන ආදායමට 71% ක් දායක කරනු ලබන කාර්මික අපනයන ක්ෂේත්‍රයට ඇතුලත් ඇගළුම් (2.86%), දියමන්ති, මැණික් හා ස්වර්ණාභරණ (1.42%), ආහාර හා බීම (41.34%), දැව ආශ්‍රිත නිමැවුම් (51.73%), කඩදාසි නිමැවුම් (496.28%), රබර් නිමැවුම් (44.88%), රසායනික හා ප්ලාස්ටික් නිමැවුම් (25.72%), ලෝහමය නොවන ඛණිජ නිමැවුම් (16.65%), මූලික ලෝහමය නිමැවුම් (75.13%), විදුලි, විද්‍යුත් සහ යාන්ත්‍රික නිමැවුම් (38.13%) සහ ඛණිජ තෙල් නිමැවුම් (66.15%) සැලකිය යුතු අපනයන ප්‍රගතියක් අත් කර ගනු ලැබීය.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන වෙළඳපලවල ප්‍රගතිය විමසීමේදී, එක්සත් ජනපදය (-3.43%) සහ සිරියාව (-5.45%) හැර අනිකුත් වෙළඳපලවලට කරනු ලැබූ අපනයනයන්ගේ කැපී පෙනෙන ප්‍රගතියක් දක්නට ලැබුණි. ශ්‍රී ලංකාවේ මුළු අපනයන ආදායමෙන් 21% කට දායක වන ඇමරිකා එක්සත් ජනපදයට 2010 වසරේදී කරනු ලැබූ අපනයනයන්ගේ 6.8% ක පමණ වර්ධනයක් වාර්තා විය. වසර 2008 සහ 2009 කාලය තුලදී එම වෙළඳපලට කරනු ලැබූ අපනයනයන් පිළිවෙලින් වාර්තා කරන ලද 4.8% සහ 15.7% ක සෘණ වර්ධනය දෙස බලන විට මෙය දිරිගන්නා සුළු ප්‍රගතියකි.



එමෙන්ම ඉහත ප්‍රස්ථාරයේ දක්වා ඇති පරිදි ඉන්දියාව (45.82%), ජර්මනිය (14.87%),ඉතාලිය (6.56%) බෙල්ජියම (1.31%), අරාබි එමීර් රාජ්‍ය (37.22%), රුසියාව (26.47%), නෙදර්ලන්තය (28.06%), සිංගප්පූරුව (484.15%) සහ ජපානය (25.40%) යන වෙළඳ පලවලට කරන ලද අපනයනයන්ගේ සැලකිය යුතු ප්‍රගතියක් දක්නට ලැබුණි.

3. අපනයන සංවර්ධන මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන සංවර්ධන වැඩ සටහන්වල ප්‍රගතිය

3.1 අපනයන වෙළඳපල සංවර්ධන වැඩ සටහන්

ශ්‍රී ලංකාවේ භාණ්ඩ හා සේවාවන් සඳහා නව වෙළඳපල අවස්ථා ලබා ගැනීමට සහ වත්මන් සහ වර්ධනය වෙමින් පවතින වෙළඳපලවල අපනයන අවස්ථා පුළුල් කර ගැනීමේ අරමුණින් අපනයන සංවර්ධන මණ්ඩලය මගින් වෙළඳපල සංවර්ධන වැඩ සටහන් රැසක් ක්‍රියාත්මක කරනු ලැබීය.

යුරෝපා කලාපය -

ශ්‍රී ලංකාවේ මුළු අපනයනයෙන් 35% ක් මෙම කලාපයට යවනු ලබන අතර, 2010 වසරේ එම කලාපයට කරනු ලබන අපනයන 5% කින් වර්ධනය විය.

අදාල කාලය තුලදී සෙල්ලම් භාණ්ඩ, කඩදාසි නිමැවුම්, ත්‍යාග භාණ්ඩ, මුහුදු නිෂ්පාදන ආදී භාණ්ඩ සඳහා ජර්මනියේ සහ බෙල්ජියමේ පැවති වෙළඳ සල්පිල් 08 සඳහා අපනයනකරුවන් 54 කගේ සහභාගිත්වයෙන් ශ්‍රී ලංකා නියෝජනය සංවිධානය කරනු ලැබීය. එමෙන්ම ශ්‍රී ලංකා අපනයන සමාගම් 10 කගේ සහභාගීත්වය ඇතිව විකුණුම් - ගැණුම්කරු හමුවක් මධ්‍යම යුරෝපයේදී සංවිධානය කරන ලද අතර සහභාගී වූ සමාගම් සඳහා ගැනුම්කරු හමු 50 ක් පමණ සංවිධානය කිරීමට හැකිවිය.

එමෙන්ම මෙම කාලය තුලදී ජර්මනිය හා
බෙල්ජියමෙන් බාහිර ගැණුම් ධූත මණ්ඩල
දෙකක් ශ්‍රී ලංකාවට ගෙන්වීමට සමත් විය
එමෙන්ම ව්‍යවසායකයින් 30 කගේ සහභාගිත්වයෙන් "වෙළඳ සල්පිල් සදහා සහභාගිත්ව සාර්ථක කර ගැනිමට සහ අපනයනකරුවන් 6 දෙනෙකු සදහා නෙදර්ලන්තයේ CBI ආයතනයේදී අපනයනය සදහා පුහුණු කිරිමකී පිළිබද වැඩමුළු දෙකක් මෙම කාලය තුලදී සංවිධානය කරනු ලැබිය.

ඇමරිකානු කලාපය -

ශ්‍රී ලංකාවේ මුළු අපනයන ආදායමෙන් 23% කට මෙම කලාපය දායකවන අතර, 2010 වසර තුලදී එම කලාපයට කරන ලද අපනයනයන්ගේ 7.8% ක වර්ධනයක් වාර්තා කරනු ලැබිය.

අදාල කාලය තුලදී අපනයනකරුවන් 5 කගේ සහභාගිත්වයෙන් "International Boston Sea food show - USA" සහ අපනයනකරුවන් 5 කගේ සහභාගිත්වයෙන් "IFT Show 2010 - Chicago" සහ අපනයනකරුවන් අටකගේ සහභාගිත්වයෙන් "JCK) Las Vegas show - USA" යන අන්තර්ජාතික වෙළඳ සල්පිල් සංවිධානය කරනු ලැබිය. නිවයෝර්ක්හි "WWD Global Sourcing Forum" සහ "WWD Retail CEO Summit" සඳහා ද ශ්‍රී ලංකා සහභාගිත්වය සංවිධානය කරන ලදී.

මීට අමතරව "ලතින් ඇමරිකානු වෙළඳපල" පිළිබඳව දැනුවත් කිරීමේ වැඩ සටහනක් අපනයනකරුවන් 65 ගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී. එමෙන්ම අපනයනකරුවන් 50 කගේ සහභාගිත්වයෙන් පාවහන් සහ ඇගළුම් පිළිබද සම්මන්ත්‍රණයක් සහ කැනඩා ගැනුම්කරුවන් දෙදෙනෙකු සමග වෙළඳ හමුවක්ද ගාල්ල සහ කොළඹදී සංවිධානය කරනු ලැබිය. ශ්‍රී ලංකාවේ ඇමරිකානු තානාපති කාර්යාලය හා එක්ව ව්‍යාපාර කිරීම පිළිබඳ සම්මන්ත්‍රණ කොළඹ, ගාල්ල, මහනුවර හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයන් හි සුළු හා මධ්‍ය ව්‍යවසායකයන් සඳහා සංවිධානය කරන ලදී.

ආසියා සහ ඕස්ට්‍රේලියානු කලාපය -

ශ්‍රී ලංකා අපනයනයන්ගෙන් 20% ක් මෙම කලාපය ආනයනය කරනු ලබන අතර අදාල කාලය තුලදී එම වෙළඳපලට කරනු ලැබූ අපනයනයන්ගේ 22.23% ක ඉහළ ප්‍රගතියක් වාර්තා කරනු ලැබිය.

ජපානයේ "Foodex", ඉන්දියාවේ "Aahar", දකුණු කොරියාවේ "Seoul International Exhibition" mlsia:dkfha "My Karachi, සහ Expo, නේපාලයේ 10 වන SAARC වෙළඳ ප්‍රදර්ශනය සහ 11 වන බටහිර චීන අන්තර්ජාතික වෙළඳ ප්‍රදර්ශනය යනාදිය සඳහා

අපනයනකරුවන් 62 කින් සමන්විත ශ්‍රී ලංකා සහභාගිත්වය සංවිධානය කරන ලදී. මීට අමතරව අපනයනකරුවන් 83 ගේ සහභාගිත්වයෙන් චීනයේ කුන්මින්හි පැවති "3rd South Asian Countries Trade Fair" මණ්ඩලය මගින් සංවිධානය කරනු ලැබීය.

එහිදී හොදම වෙළද කුටියට හිමිවන ස්වර්ණමය සම්මානය දිනාගැනීමට ශ්‍රී ලංකාව සමත් විය මීට අමතරව ලංකා වාණිජ මණ්ඩලය හා එක්ව සමාගම් 5 ගේ සහභාගිත්වයෙන් වෙළද සම්බන්ධතා ප්‍රවර්ධන වැඩ සටහනක් බංගලාදේශයේදී සංවිධානය කරන ලදී

චීනයේ පැවති Domotex 2010 අන්තර් ජාතික ප්‍රදර්ශණය හා සමගාමීව අපනයනකරුවන් 04 ක් සදහා තාක්ෂණය පිළිබඳ දැනුවත් වීම සඳහා අවස්ථාවක් ලබා දෙන ලදී. සකස් කරන ලද ආහාර නිෂ්පාදනයේ යෙදෙන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් 8 දෙනෙක් තායිලන්තයේදී තාක්ෂණය පිළිබඳ දැනුවත් වීමේ හා ව්‍යාපාර සංවර්ධනය පිළිබඳ වැඩ සටහනක් සඳහා සහභාගි කරන ලදී. එමෙන්ම අපනයනකරුවන් 8 ක් තායිලන්තයේ 'Tuna Conference' සදහා සහභාගි කරවන ලදී.

"ඉන්දියානු වෙළදපලේ ශ්‍රී ලංකා රබර් නිමැවුම් සඳහා ඇති අවස්ථාවන්" පිළිබද සම්මන්ත්‍රණයක් සහ ඉන්දියානු රබර් කර්මාන්ත සම්මේලනයේ සහාය ඇතිව "Rubber Expo" වෙළද සල්පිලට සමගාමීව ප්‍රචාරක සන්දර්ශනයක්ද පවත්වනු ලැබීය.

මැදපෙරදිග, අප්‍රිකා සහ ස්වාධීන පොදු රාජ්‍ය (CIS) කලාපය :

ශ්‍රී ලංකා මුළු අපනයනයන්ගෙන් 15% කට පමණ දායක වන මෙම කලාපයට 2010 වසර තුල කරන ලද අපනයනයන්ගේ 21% ක ප්‍රගතියක් දක්නට ලැබුණි.

අදාල කාලය තුලදී "Cairo International Trade Fair " " Interior & Buildex Fair - Muscat," "Gulf Food - Dubai " iy "SAITEX) 2010 - South Africa" යන අන්තර් ජාතික වෙළද සල්පිල් සඳහා ශ්‍රී ලංකා සහභාගිත්වය සංවිධානය කරන ලද අතර මෙම වෙළද සල්පිල් සඳහා අපනයනකරුවන් 35 ක් පමණ සහභාගි විය. දකුණු අප්‍රිකාවේ පැවති "SAITEX - 2010" හා සමගාමීව ප්‍රචාරක සංදර්ශනයක් ද පවත්වනු ලැබීය. මීට අමතරව අදාල කාලය තුලදී සය දෙනෙකුගෙන් යුතු පලස්තීන ගැණුම් ධූත මණ්ඩලයක හමුවක් ශ්‍රී ලංකාවේදී සංවිධානය කරන ලදී.

අපනයනකරුවන්ගේ වෙළදපල ප්‍රවර්ධන වැඩ සටහන් සඳහා සහාය වීම

මණ්ඩලය මගින් සංවිධානය කරනු ලබන වෙළදපල වැඩ සටහන්වලට අමතරව අපනයනකරුවන් විසින් කරනු ලබන වෙළදපල සංවර්ධන වැඩ සටහන් සඳහාද මණ්ඩලය සහාය දැක්වීය. අදාල කාලය තුලදී, ඒ අනුව අපනයනකරුවන් දස දෙනෙකු සඳහා රු . මිලියන. 1.38 ක් ප්‍රතිපූර්ණය කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී.

3.2 අපනයන සැපයුම් දාම සංවර්ධන වැඩ සටහන්

අපගේ ප්‍රධාන අපනයනයන් වන එළවළු හා පළතුරු, කැපූ මල් සහ විසිතුරු පැල, පොල් ආශ්‍රිත නිමැවුම්, කුළුබඩු, ආහාර හා බීම, ධීවර නිමැවුම්, විසිතුරු මත්ස්‍යයින්, මැණික් හා ස්වර්ණාභරණ, ඇඟළුම්, රබර් සහ ප්ලාස්ටික් නිමැවුම්, හම් භාණ්ඩ, පාවහන්, බෝට්ටු, සෙල්ලම් සහ ත්‍යාග භාණ්ඩ, ලුහු ඉංජිනේරු නිමැවුම්, තොරතුරු හා සංනිවේදන තාක්ෂණය සහ වෘත්තිමය සේවාවන්හි සැපයුම් දාම කාර්යක්ෂමතාවය වැඩි කරලීම සඳහා ඒකාබද්ධ සැපයුම් / නිෂ්පාදිත / තත්ව / මෝස්තර / වෙළඳපල සංවර්ධන වැඩ සටහන් රැසක් මෙම කාලය තුලදී මණ්ඩලය ක්‍රියාත්මක කරනු ලැබිය. ප්‍රධාන වැඩ සටහන් කිපයක ලුහුඩු විස්තරයක් පහත දැක්වේ.

3.2.1 කෘෂි අපනයන කලාප පිහිටුවීම

2009 අයවැය යෝජනාවකට අනුව ගොවි කණ්ඩායම් සම්බන්ධ කර ගනිමින් ව්‍යාපෘති රැසක් මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරනු ලැබිය. මෙම වැඩ සටහනේ ප්‍රධාන අරමුණ වූයේ අපනයන සඳහා කෘෂි සැපයුම් පදනම පුළුල් කිරීම සහ අපනයනයේ ප්‍රතිලාභ ග්‍රාමීය ජනතාව වෙත ලබාදීමය. මේ යටතේ ක්‍රියාත්මක කල වැඩ සටහන්වල ප්‍රගතිය පහත ලුහුඩින් දක්වා ඇත.

- අම්පාර දිස්ත්‍රික්කයේ කහ වගාව

මෙම ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ අම්පාර දිස්ත්‍රික්කයේ ගොනාගොල්ල, උහන සහ මායාදුන්නේ යන ප්‍රදේශවල ගොවීන් 197 කට අක්කර 38.25 ක කහ වගා කිරීම සඳහා සහාය ලබා දුනි. ව්‍යාපෘතිය සදහා අවශ්‍ය පැල ලබා ගැනීම සඳහා අක්කර 15 ක නියමු තවාන් ව්‍යාපෘතියක්ද ආරම්භ කරන ලදී.

- නැගෙනහිර පළාතේ අන්නාසි වගාව

මෙම ව්‍යාපෘතිය යටතේ නාමල් ඔය, වේරකැටන්ගොඩ, මාණික්ක මඩු, පල්ලන් ඔය, කොඩිවිල්, මධ්‍යම කදවුර සහ දීඝවාපි යන ප්‍රදේශවල ගොවීන් 200 ට අන්නාසි පැල මිලියන 1.2 ක් ලබා දීමට සැලසුම් කර තිබේ. දැනට ගොවීන්, අක්කර 44 ක අන්නාසි පැල 174,401 ක් වගා කර තිබේ.

- කල්මුණේ මරුවැල් පන්න තාක්ෂණය යටතේ මසුන් ඇල්ලීමේ ව්‍යාපෘතිය :

අපනයන සඳහා තත්වයෙන් උසස් කෙලවල්ලන් ඇල්ලීම උනන්දු කර ලීම අරමුණු කර ගත් මෙම ව්‍යාපෘතිය යටතේ තෝරා ගත් බහුදින ධීවර යාත්‍රා හිමියන් 50 ට මසුන් ඇල්ලීම පිළිබඳ ප්‍රායෝගික පුහුණුවක් ලබා දෙන ලදී.

එමෙන්ම ඔවුන් අතර බිලි කොකු 200 ක් සහිත මරුවැලි පන්න කට්ටල 50 ක් බෙදා දෙන ලද අතර ඔවුන්ගේ ප්‍රයෝජනය සඳහා පාවෙන ජැට්යක් ද සවිකරන ලදි මසුන් ඇල්ලීම වඩාත් විධිමත් නිරීම සඳහා අවශ්‍ය සන්නිවේදන කට්ටල(GPS) 50 ක්ද ඔවුන් අතර බෙදා දීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර තිබේ

- **පොළොන්නරු දිස්ත්‍රික්කයේ අපනයනය සඳහා විසිතුරු මසුන් බෝ කිරීමේ ව්‍යාපෘතිය -**

මෙම ව්‍යාපෘතියේ පළමු හා දෙවන අදියරයන් යටතේ තෝරා ගත් ගොවීන් 100 ට කර්මාන්තය සඳහා අවශ්‍ය ආම්පන්න කට්ටල ලබා දී තිබේ. එහි තෙවන අදියර යටතේ සහාය දීම සඳහා ගොවීන් 125 ක් තෝරා ගෙන තිබේ.

- **බිංගිරිය කැපූ මල් හා විසිතුරු පැල වගා කිරීමේ හා සැකසීමේ ව්‍යාපෘතිය -**

මෙම ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ තෝරා ගත් ගොවීන් අතර ඇන්තූරියම් වගා ගෘහ 100 ක් සහ විසිතුරු පැල වගා ගෘහ 100 ක් බෙදා දීමට නියමිතය. සියළුම තෝරා ගත් ගොවීන්ට අවශ්‍ය පුහුණුව දැනටමත් ලබා දී ඇති අතර ඇන්තූරියම් වගා ගෘහ 50 ක් ලබා දීමට ද කටයුතු කර තිබේ. ඉතිරි වගා ගෘහ 150 ගොවීන් අතර බෙදා දීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇති අතර ව්‍යාපෘතිය සඳහා පොදු සැකසුම් මධ්‍යස්ථානයක් පිහිටුවීමේ කටයුතු ද නිම වෙමින් පවතී. මීට අමතරව “මග නැගුම“ ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘතිය සඳහා මාර්ගයක් ඉදි කිරීමේ කටයුතු ද අඩක් පමණ නිම කර තිබේ.

- **වීරවිල අපනයනය සඳහා එළවළු හා පළතුරු වගා කිරීමේ ව්‍යාපෘතිය -**

මෙම ව්‍යාපෘතිය තිස්සමහාරාම අපනයන නිෂ්පාදන ගම්මාන සමාගම යටතේ ක්‍රියාත්මක වන අතර අක්කර 19 ක භූමි ප්‍රමාණයක් එයට ඇතුලත් වේ. දැනට අඹ, පැපොල්, මුරුංගා, කෙසෙල් සහ තල මෙම ව්‍යාපෘතිය යටතේ වගා කර තිබේ.

- **දකුණු පළාතේ ගුණාත්මක ලෙස කුරුඳු සැකසීමේ වැඩ සටහන -**

මේ යටතේ සෞඛ්‍යාරක්ෂිත නිෂ්පාදන ක්‍රම (GMP) භාවිතා කරන කුරුඳු සැකසුම් මධ්‍යස්ථාන 20 ක් පිහිටුවීමට අරමුණු කර ගෙන තිබේ ඒ අනුව දැනටමත් මධ්‍යස්ථාන 15 ක් පිහිටුවා සැකසුම් කටයුතු ආරම්භ කර ඇති අතර ඉතිරි සැකසුම් මධ්‍යස්ථාන 5 ක කටයුතු නිම වෙමින් පවතී මීට අමතරව අතිරේක GMP මධ්‍යස්ථාන 11 ක් දිවයින පුරා පිහිටුවීමටද කටයුතු සම්පාදනය කරමින් පවතී

3.2.2 අනෙකුත් සැපයුම් දාම සංවර්ධන වැඩ සටහන්

ජාතික කාබනික නිමැවුම් සහතික කිරීමේ වැඩ සටහන

ශ්‍රී ලංකාවේ කාබනික නිෂ්පාදන පදනම සංවර්ධනය කිරීමේ අරමුණෙන්, කාබනික නිෂ්පාදනයන්හි නියැලෙන ව්‍යවසායකයින්ට කාබනික සහතික නිකුත් කිරීමට පහසු කිරීමේ අරමුණින් අ.ස.ම, Eu හා GTZ එක්ව ජාතික කාබනික සහතික (සීමාසහිත) ලිමිටඩ් පිහිටුවන ලදී. ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ, අ.ස.ම, අපනයනය සංවර්ධන පණත යටතේ ජාතික කාබනික සහතික අධිකාරිය (NOCA) පිහිටුවීමට කටයුතු සම්පාදනය කරමින් සිටී. එමෙන්ම මේ සඳහා අවශ්‍ය නිතිමය කටයුතු අවසන් කර ඇති අතර කැබිනට් අනුමැතිය අපේක්ෂාවෙන් සිටී.

- ඒකාබද්ධ ආදර්ශ කෘෂි ව්‍යාපෘතිය (IAMP) -

මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණු වන්නේ ගොවි කණ්ඩායම්වල සහභාගිත්වය ඇතිව ප්‍රාදේශීය කෘෂිකාර්මික කටයුතු සඳහා ආයෝජකයින් උනන්දු කරලීමත්, එමගින් අපනයනය සඳහා අවශ්‍ය ගුණාත්මක නිමැවුම් ලබා ගැනීමට කටයුතු කිරීමත් ය. මෙම වැඩ සටහන යටතේ දිවයිනේ දිස්ත්‍රික්ක 12 ක් ආවරණය වන පරිදි කෘෂි ව්‍යාපෘති 49 ක් අනුමත කරන ලදී. දැනට ව්‍යාපෘති 30 ක් වගා කටයුතු ආරම්භ කර තිබෙන අතර රු. මිලියන 75.95 ක මුදලක් එම ව්‍යාපෘතීන්හි ආයෝජනය සඳහා ලබා දෙන ලදී.

- තත්ව කළමනාකරණ සහතික ලබා ගැනීමට සහාය වීම :

ජාත්‍යන්තර වෙළඳපලට පිවිසීම සඳහා අවශ්‍ය GAP, GMP, HACCP, ISO 22000 ආදී සහතික ලබා ගැනීම සඳහා අපනයනකරුවන්ට සහාය වීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. මෙම ව්‍යාපෘතිය යටතේ අපනයනකරුවන් 23 ක් අයදුම් කර ඇති අතර අපනයනකරුවන් 8 දෙනෙක් මණ්ඩලයේ සහාය ඇතිව අදාල තත්ව සහතික ලබා ගැනීමට සමත් වී තිබේ.

- සහල් ආශ්‍රිත නිමැවුම් සංවර්ධනය -

අපනයනය සඳහා සහල් ආශ්‍රිත පහසු සහ නව නිෂ්පාදිත සැකසීම දිරි ගැන්වීමේ අරමුණින් ඇරඹි මෙම ව්‍යාපෘතිය යටතේ ආහාර සැකසීමේ සමාගම් 3 ක් තෝරා ගෙන තිබේ. ඉන් සමාගම් දෙකක් දැනටමත් නව නිමැවුම් සැකසීම සඳහා අවශ්‍ය යන්ත්‍ර හා උපකරණ මිලදී ගෙන තිබේ.

- ලංකා කුරුඳු වෙළඳ සන්නම් නාම ප්‍රවර්ධන වැඩ සටහන -

ජාත්‍යන්තර වෙළඳපොලේ ශ්‍රී ලංකාවේ කුරුඳු සඳහා ඇති පිළිගැනීම මත Ceylon Cinnamon වෙළඳ නාමය ප්‍රවර්ධන කිරීමේ වැඩ සටහනක් මණ්ඩලය මගින් දියත් කර තිබේ. මේ සඳහා ජාතික බුද්ධිමය දේපල කාර්යාලය හා එක්ව අවශ්‍ය නීති හා රෙගුලාසි මෙන්ම කුරුඳු ලාංජනය" සම්පාදනය කරමින් තිබේ.

- ත්‍යාග සහ සෙල්ලම් භාණ්ඩ සංවර්ධනය -

අපනයන වෙළඳ පල සඳහා ප්‍රමිතියෙන් යුත් භාණ්ඩ නිපදවන සුළු හා මධ්‍ය පරිමාණ නිෂ්පාදකයින් කණ්ඩායමක් බිහි කරලීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණයි මෙම ව්‍යාපෘතියේ පළමු හා දෙවෙනි අදියරයන් යටතේ දැනටමත් නිෂ්පාදකයන් 60 ක් සංවර්ධනය කර තිබේ

දෙවෙනි අදියරේ වෙළඳපල සංවර්ධන වැඩ සටහන යටතේ චීනයේ කුන්මින් හි මෙම වසරේදී පැවති ජාත්‍යන්තර වෙළඳ සල්පිලකට සහභාගීවීම සඳහා නිෂ්පාදකයින් 15 කට අවස්ථාව සලසා දෙන ලදී.

මෙම ව්‍යාපෘතියේ තෙවැනි අදියරේ නිෂ්පාදිත හා මෝස්තර සංවර්ධන වැඩ සටහන, එක්සත් රාජධානියේ සහ ප්‍රංශයේ මෝස්තර නිර්මාණකරුවන් 13 ගේ සහාය ඇතිව ආරම්භ කර තිබේ. දැනට එම විදේශීය මෝස්තර නිර්මාණකරුවන් හපුවිද, තලගුණේ, මරදමුල, පිළිමතලාව, කොවුල් ආර සහ මාගාල්ල ආදී ප්‍රදේශවල කලා ශිල්පීන්ට ජාත්‍යන්තර වෙළඳපලට ගැලපෙන ත්‍යාග භාණ්ඩ නිපදවීම සඳහා අවශ්‍ය උපදෙස් දීමේ නිරත වී සිටිති. මෙම ශිල්පීන්ගේ මෝස්තර එකතුව, 2010 නොවැම්බර් මාසයේ පැවැති නියමිත ශ්‍රී ලංකා මෝස්තර සැණකෙළිය" ට සමගාමීව පැවැත්වෙන ශිල්ප ප්‍රදර්ශනයට ඉදිරිපත් කරන ලදී.

එයට අමතරව, අපනයනට නැඹුරු වූ ව්‍යවසායකයින් 40 කගේ සහභාගීත්වයෙන් "සෙල්ලම් භාණ්ඩ සඳහා අවශ්‍ය ජාත්‍යන්තර සහතික සහ ප්‍රමිතීන්" පිළිබඳ වැඩ මුළුවක් කොළඹදී සංවිධානය කරනු ලැබිය.

- ඇඟළුම් අපනයන ප්‍රවර්ධනය :

ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙලඳ ගිවිසුමෙන් ලබා දී ඇති තීරුබදු සහනවලින් උපරිම වෙළඳ වාසි ලබා ගැනීමේ අරමුණින් වැඩ සටහන් කිපයක් මණ්ඩලය දියත් කරනු ලැබීය. ඉන්දියාවේ පැවති "Global India Textile Show - 2010" සඳහා නිල නියෝජිත කණ්ඩායමක් සහභාගී වූ අතර ඉන්දියාවේ බලවේග පේෂකර්ම සහ අපනයන ප්‍රවර්ධන කවුන්සලයේ නිලධාරීන්ගේ නිල සංචාරයද සංවිධානය කරනු ලැබිය.

ශ්‍රී ලංකාවේ ඇඟළුම් කර්මාන්තයේ මෝස්තර හැකියාවන් ප්‍රදර්ශනය කිරීමට සහ අපනයන අවස්ථා ප්‍රවර්ධනය කර ගැනීමට අවස්ථාව සැලසීමේ අරමුණින් 2010 නොවැම්බර් මාසයේදී "ශ්‍රී ලංකා මෝස්තර සැණකෙළිය" පැවැත්වීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර තිබේ. මෙම සැණකෙළියේදී ශ්‍රී ලංකා ඇඟළුම් නිෂ්පාදිතයන් සඳහා ඉහළ ජාත්‍යන්තර අවධානයක් යොමු කර ගැනීමේ අරමුණින් විදේශ ගැනුම්කරුවන්, ජනමාධ්‍යකරුවන් සහ අනිකුත් වෙළඳ බලපෑම් කණ්ඩායම්" සහභාගී කරවා ගැනීමට මණ්ඩලය කටයුතු කරමින් සිටී.

එමෙන්ම ශ්‍රී ලංකා ඇඟළුම් ආයතනය සංවිධානය කළ 'ශ්‍රී ලංකා මෝස්තර සතියට සමගාමීව ඇඟළුම් කර්මාන්තය සඳහා වෙළඳ නාම සහ රෙදිපිළි " පිළිබඳ තාක්ෂණික වැඩ මුළුවක් නොවැම්බර් මස 15 සිට 20 දක්වා පවත්වන ලදී. මේ සඳහා එංගලන්තයේ Fashion of College හි විශේෂඥයන් දෙදෙනෙකුගේ උපදේශකත්වය ලබා ගන්නා ලදී.

ශ්‍රී ලංකා මෝස්තර සැණකෙළිය - 2010

ශ්‍රී ලංකා මෝස්තර සැණකෙළිය [SLDF] 2010 දෙවන වරටත් නොවැම්බර් මස 11 - 16 දක්වා ගල්කිස්ස හෝටලයේදී සාර්ථකව පැවැත්විණ. මෙවර සැණකෙළියේ තේමාව වූයේ 'නිර්මාණකරණය, නව්‍යකරණය සහ තිරසාර බවේ සැමරුම" යන්නයි.

මෙය ශ්‍රී ලංකාවේ නිර්මාණශීලි කර්මාන්ත හා යහපත් ආචාර ධර්ම වලින් යුතු ඇගළුම් නිෂ්පාදන කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා වූ එකම සැණකෙළියයි.

මෙම විශේෂ වැඩ සටහන, ආදර්ශ කලා ශිල්පීන්, කලා ගම්මානයක්, ප්‍රදර්ශණ, මෝස්තර දැක්මන්, ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ හා වැඩමුළු ආදී කොටස් 100 කට අධික ප්‍රමාණයක් සමන්විත විය.

මෙම මෝස්තර සැණකෙළිය, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය මෝස්තර ඇකඩමිය හා අදාල ආයතන රැසක් එක්ව සංවිධානය කරන ලදි.

මෙම වැඩ සටහන මගින් කලා ශිල්පි ගම්මානයක් ආරම්භ කරන ලදි. මෙහිදී ප්‍රදර්ශනය කරන ලද තෑගි භාණ්ඩ හා කලා ශිල්ප එකතුව නිෂ්පාදනය කළ කර්මාන්තකරුවන් සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය මගින් පූර්ව තාක්ෂණ සහායක් විදේශීය විශේෂඥයින් මගින් ලබා දෙන ලදි.

- බෝට්ටු කර්මාන්තය සංවර්ධනය කිරීම -

ශ්‍රී ලංකාවේ බෝට්ටු කර්මාන්තයේ හැකියාවන් ගැනුම්කරුවන්ට ප්‍රදර්ශනය කිරීමේ අරමුණින් බෝට්ටු කර්මාන්ත තාක්ෂණික සංවර්ධන ආයතනය (BTI) සමග එක්ව "The Boat Show - 2010" ප්‍රදර්ශනය කොළඹ සංවිධානය කරනු ලැබීය. මෙම ප්‍රදර්ශනය සඳහා නියෝජිතයින් 10 ක් සමන්විත පකිස්ථාන වෙළඳ කණ්ඩායමක් සහ තිදෙනෙකුගෙන් සමන්විත ඉන්දියානු වෙළඳ නියෝජිත කණ්ඩායමක්ද සහභාගී කරවීමට මණ්ඩලය කටයුතු කරන ලදි. 2011 ඩුබායි අන්තර් ජාතික බෝට්ටු ප්‍රදර්ශනය සඳහා පළමු ශ්‍රී ලාංකිය සහභාගිත්වය සංවිධානය කිරීමට කටයුතු සම්පාදනය කෙරේ.

- පාවහන් සහ සම්භාණ්ඩ ප්‍රදර්ශනය -

අනිකුත් අදාල පාර්ශවයන් හා එක්ව "පාවහන් සහ සම්භාණ්ඩ ප්‍රදර්ශනය" 2010 නොවැම්බර් මස 5 සිට 7 දක්වා කොළඹදී පැවැත්විණ. මෙය ශ්‍රී ලංකාවේ පැවැත් වූ තෙවැනි සම්භාණ්ඩ ප්‍රදර්ශනය වන අතර කර්මාන්තයේ හැකියාවන් දේශීය හා විදේශීය ගැනුම්කරුවන්ට ප්‍රදර්ශනය කිරීම ප්‍රධාන අරමුණ වී තිබේ.

නිෂ්පාදකයින් සහ අපනයනකරුවන් 170 ක් පමණ තම සම්භාණ්ඩ ආශ්‍රිත නිමැවුම් මෙහිදි ප්‍රදර්ශනය කල අතර යුරෝපා සංගමයෙන් සහ ඉන්දියාවෙන් වෙළඳ නියෝජිත කණ්ඩායම් ප්‍රදර්ශනය සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය මගින් ගෙන්වන ලදි

ප්‍රදර්ශනය හා සමගාමීව මෝස්තර දැක්මක්, මෝස්තර තරගාවලියක් මෙන්ම විවිධ සම්මන්ත්‍රණ හා වැඩමුළු රාශියක් පවත්වන ලදී. ශ්‍රී ලාංකිය දක්ෂතා සහ මෝස්තර 'මෝස්තර දැක්ම' මගින් එළි දැක් වූ අතර පාවහන් හා සම් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදකයන් දිරි ගැන්වීමේ හා තරුණ පරපුර මෙම කර්මාන්තයට ආකර්ශනය කිරීමේ අරමුණින් "මෝස්තර තරගාවලිය" සංවිධානය කරන ලදී.

- පිගන් භාණ්ඩ අපනයනය -

පිගන් සහ පෝසිලේන් භාණ්ඩ පිළිබද තාක්ෂණික අත්පොතක් මුද්‍රණය කරනු ලැබීය.

- වාත්තු කර්මාන්ත සංවර්ධනය -

වාත්තු කර්මාන්තයේ තාක්ෂණය ඉහළ නැංවීමේ අරමුණින් දියත් කළ වැඩසටහන යටතේ සමාගම් දෙකකට සහාය ලබා දීමට නිර්දේශ කර ඇති අතර ව්‍යාපෘති 6 ක් පිළිබඳව මූල්‍යමය ශක්‍යතා අධ්‍යයනය නිම කරමින් පවතී.

- "Facets - 2010" - ප්‍රදර්ශනය -

ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ නිෂ්පාදකයින්ගේ සම්මේලනය හා එක්ව සංවිධානය කල "Facets - 2010" මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනයේදී, සුළු හා මධ්‍ය පරිමාණ අපනයනකරුවන් 17 කට තම නිෂ්පාදිත, ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව සලසා දෙනු ලැබීය.

මෙමගින් එම නිෂ්පාදකයන්ට වෙළඳපල ප්‍රවණතා පිළිබද දැනුමක් ලබා ගැනීමටත් ප්‍රධාන අපනයන කරුවන් සමග වෙළඳ සබඳතා ගොඩනගා ගැනීමටත් අවස්ථාව සැලසුනි

- සේවා අපනයනය ප්‍රවර්ධනය කිරීම -

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරනය සහ වෘත්තිමය සේවා අපනයන සංවර්ධන ක්‍රියාවලියේ ප්‍රධානතම අංශයන් ලෙස හඳුනා ගෙන තිබේ. මෙම අංශයන් පිළිබද ශ්‍රී ලංකාවේ හැකියාවන් මුළු ලොවටම විදහා දැක්වීම සඳහා වෙබ් අඩවි දෙකක් නිර්මාණය කර දියත් කරනු ලැබීය.

එමෙන්ම 2010 ඔක්තෝම්බර් මාසයේදී ඩුබායි පැවැත් වූ (GITEX) 2010, වෙළඳ සල්පිලට ශ්‍රී ලංකා අපනයනකරුවන් 7 කින් සමන්විත ශ්‍රී ලංකා සහභාගිත්වය මණ්ඩලය විසින් සංවිධානය කරන ලදී.

මීට අමතරව සේවා අපනයන ක්ෂේත්‍රයේ නියැලි ව්‍යාපාරිකයින් 90 කගේ පමණ සහභාගීත්වයෙන්, 'සේවා අපනයන ක්ෂේත්‍රය පිළිබඳ නීතිමය පරිසරය' සහ 'අන්තර් සංස්කෘතික සන්නිවේදනය'

පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු දෙකක් ද පවත්වනු ලැබිය. එමෙන්ම මෙම සේවා අංශයන්ගේ අපනයන දායකත්වය පිළිබද සමීක්ෂණයක් පැවැත්වීමටද කටයුතු කරමින් පවතී.

3.3 ප්‍රාදේශිය අපනයන සංවර්ධන වැඩ සටහන්

අපනයන සංවර්ධනය උදෙසා ග්‍රාමීය සම්පත් සහ හැකියාවන් දායක කර ගැනීමේ අරමුණින් අපනයන සංවර්ධන මණ්ඩලයේ ප්‍රාදේශිය කාර්යාල මගින් සංවර්ධන වැඩ සටහන් රැසක් ක්‍රියාත්මක කරනු ලැබිය. අදාල කාලය තුල ක්‍රියාත්මක කල ප්‍රධාන ප්‍රාදේශිය වැඩ සටහන්වල ලුහුඩු විස්තරයක් පහත දක්වා ඇත.

දකුණු පළාත -

එළවළු හා පළතුරු වගා ව්‍යාපෘතිය -

කෘෂි අපනයන කලාප යටතේ වීරවිල පිහිටුවා ඇති මෙම ව්‍යාපෘතිය පිළිබද විස්තරයක් ඉහත 3.2 හි දක්වා ඇත

- **තිස්සමහාරාම අපනයන නිෂ්පාදන ගම්මානය -**

සාමාජිකයින් 500 කගෙන් සමන්විත මෙම මහජන සමාගමේ කටයුතු සුපරීක්ෂණය අපනයන සංවර්ධන මණ්ඩලය මගින් අඛණ්ඩව සිදු කෙරේ. තේ ඇසුරුම් කිරීම සඳහා පන් පෙට්ටි නිපදවන මෙහි කටයුතු විවිධාංගිකරණය සඳහා සාමාජිකයින් අත් යන්ත්‍ර සළුපිළි නිපදවීමට පෙළඹවීමටද කටයුතු කරන ලදී. මේ යටතේ අවශ්‍ය අත් යන්ත්‍ර 05 ක් සවි කිරීමට සහ පුහුණු කිරීම්වලට මණ්ඩලය අවශ්‍ය සහාය ලබා දෙන ලදී.

- **මැණික් හා ස්වර්ණාභරණ නිෂ්පාදන සංවර්ධනය -**

මණ්ඩලය මගින් දියත් කරන ලද ඒකාබද්ධ නිෂ්පාදන / මෝස්තර / වෙළඳපල සංවර්ධන වැඩ සටහන යටතේ දකුණු පළාතේ ස්වර්ණාභරණ ශිල්පීන් 18 ක් සදහා නිපුණතා සංවර්ධන වැඩ සටහනක් ක්‍රියාත්මක කරනු ලැබිය. මෙම ශිල්පීන් සඳහා චීනයේ පැවැති කුන්මින් වෙළඳ සල්පිල, ලාස් වේගාස් හි පැවැති ස්වර්ණාභරන වෙළඳ ප්‍රදර්ශනයට සහ ශ්‍රී ලංකාවේ පැවති "Facets - 2010" ප්‍රදර්ශනයට තම නිෂ්පාදිත ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙනු ලැබිය.

මීට අමතරව දකුණු පළාතේ ගාල්ල හා හම්බන්තොට ප්‍රාදේශිය කාර්යාල මගින් වෙළඳ තොරතුරු, විද්‍යුත් වාණිජ සේවා සහ උපදේශක සේවා පළාතේ ව්‍යවසායකයින් වෙත ලබා දෙන ලදී.

උතුරු පළාත

දැනට මණ්ඩලයේ සම්බන්ධීකරණ කාර්යාලයක් යාපනයේ පිහිටුවා ඇති අතර පළාතේ අපනයන සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා මන්නාරමේ පළාත් කාර්යාලයක් පිහිටුවීමටද කටයුතු යොදමින් ඇත. මන්නාරම් දිස්ත්‍රික්කයේ පෙරියමඩු, පුඩුක්කුලම් සහ පලේ පෙරිමාල්කට්ටු ගම්මාන ආවරණ වන පරිදි අමුමිරිස් වගා කිරීම් ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති අතර දැනට ඒ සඳහා ගොවීන් 411 ක් තෝරා ගෙන ඔවුන්ට බීජ ලබා දී තිබේ.

මධ්‍යම පළාත -

කුළුබඩු සංවර්ධන ව්‍යාපෘතිය -

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා එක්ව අගය එකතු කල කුළුබඩු නිෂ්පාදිත සංවර්ධනය සඳහා ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතිය සඳහා දැනට ගොවීන් 125 ක් තෝරා ගෙන තිබේ. මීට අමතරව ව්‍යවසායකයින් 100 කගේ සහභාගිත්වයෙන් අගය එකතු කල කුළුබඩු පිළිබඳ දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ දෙකක් රත්තොට සහ පල්ලේපොල ප්‍රදේශවලදී පවත්වන ලදී.

විසිතුරු මත්ස්‍ය සංවර්ධන ව්‍යාපෘතිය -

මෙම ව්‍යාපෘතිය යටතේ මත්ස්‍ය වගා ඒකක 35 ක් පිහිටුවා අපනයනකරුවෙකුට සම්බන්ධ කිරීමට අදහස් කර ඇති අතර තෝරා ගත් ව්‍යවසායකයින් සඳහා මූලික පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

කැපූ මල් සහ විසිතුරු පැල සංවර්ධන ව්‍යාපෘතිය -

මෙම ව්‍යාපෘතිය යටතේ වගා ඒකක 30 ක් මාතලේ දිස්ත්‍රික්කයේ සහ වගා ඒකක 20 ක් නුවර එළිය හා කෑගල්ල දිස්ත්‍රික්ක ආවරණය වන පරිදිද පිහිටුවීමට නියමිතය. මෙයට සමගාමීව අපනයනය සඳහා මල් සහ විසිතුරු පැල වගා කිරීම පිළිබද සම්මන්ත්‍රණ දෙකක් අඹගමුව සහ මාතලේ ප්‍රදේශවලදී ගොවීන් 90 ගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී.

නිෂ්පාදිත සහ මෝස්තර සංවර්ධන ව්‍යාපෘතිය -

අපනයන සංවර්ධන මණ්ඩලය මගින් මැණික්හින්න හා කලාසිරිගම ආශ්‍රිතව හණ කෙඳි නිෂ්පාදන, ලේවැල්ල සහ කිරිබත්කුඹුර ආශ්‍රිතව බතික් නිමැවුම්, තලගුණේ ආශ්‍රිතව අත්යන්ත්‍ර රෙදිපිළි, මාතලේ ආශ්‍රිතව බලවේග පේෂකම් නිමැවුම්, පල්ලේ කැලේ අශ්‍රිතව සේද රෙදිපිළි පිළිමතලාව ආශ්‍රිතව පිත්තල භාණ්ඩ සඳහාද සහ හපුවිද ආශ්‍රිතව ලාක්ෂා නිමැවුම් සඳහා ඒකාබද්ධ සැපයුම් හා මෝස්තර සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබේ. විදේශිය මෝස්තර නිර්මාණ ශිල්පීන්ගේ සේවය තෝරා ගත් ශිල්පීන්ට ලබා දී ඇති අතර, ඔවුන්ගේ නව නිෂ්පාදිත නොවැම්බර් මස පැවැත්වූ 'ශ්‍රී ලංකා මෝස්තර සැණකෙළියේ' දී ප්‍රදර්ශනය කරන ලදී.

වයඹ පලාත

නිපුණතා සංවර්ධන වැඩ සටහන සහ උපදේශක සේවා -
ආනයන හා අපනයන පටිපාටිය පිළිබදව සම්මන්ත්‍රණයක් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 30 ගේ සහභාගිත්වයන් පවත්වන ලදී. මීට අමතරව වෙළඳ තොරතුරු, විද්‍යුත් වාණිජ්‍යය සේවාවන් සහ උපදේශක සේවාවන් ද පළාතේ ව්‍යවසායකයින්ට ලබා දෙන ලදී.

- **කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඖෂධීය ශාඛ වගා කිරීමේ හා සැකසීමේ ව්‍යාපෘතිය -**

අපනයනය සඳහා තිරසාර සැපයුම් පදනමක් සැකසීමේ අරමුණින් ක්‍රියාත්මක කිරීමට නියමිත මෙම ව්‍යාපෘතිය පිළිබඳව පළාත් අධිකාරිය සමග එක්ව මූලික කටයුතු සම්පාදනය කරමින් පවතී.

- **නිපුණතා සංවර්ධන වැඩ සටහන් -**

අදාල කාලය තුලදී අපනයනයට සම්බන්ධ විවිධ විෂයන් පිළිබඳ සම්මන්ත්‍රණ 6 ක් පළාතේ ව්‍යවසායකයින් 200 කගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී. මීට අමතරව වෙළඳ තොරතුරු, විද්‍යුත් වාණිජ්‍යය සේවා සහ උපදේශක සේවාවන්ද පළාතේ ව්‍යවසායකයින් වෙත ලබා දෙන ලදී.

නැගෙනහිර පළාත

- කෘෂි අපනයන කලාප යටතේ ක්‍රියාත්මක අම්පාර දිස්ත්‍රික්කයේ කහ වගාව අම්පාර දිස්ත්‍රික්කයේ අන්නාසි වගාව සහ කල්මුණේ මරුවැල් පන්න තාක්ෂණ මසුන් ඇල්ලීමේ ව්‍යාපෘතියට අමතරව පහත දැක්වෙන වැඩ සටහන් නැගෙනහිර පළාත තුල ක්‍රියාත්මක කරනු ලැබීය

- **දැනුවත් කිරීමේ වැඩ සටහන් / පුහුණු වැඩ සටහන් -**

ත්‍රිකුණාමලය සහ අම්පාර දිස්ත්‍රික්කයේ ව්‍යවසායකයින් 156 ක සහභාගිත්වයෙන් දැනුවත් කිරීමේ වැඩ සටහන් 3 ක් සංවිධානය කරනු ලැබීය. මීට අමතරව බිම්මල්, අන්නාසි සහ කහ වගාව, අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදන සහ පන් භාණ්ඩ නිෂ්පාදකයින් සඳහා අම්පාර සහ මඩකලපුව දිස්ත්‍රික්ක වලදී පුහුණු වැඩ සටහන් 05 ක් සංවිධානය කරනු ලැබීය.

ඌව පළාත

- **බෙල් පෙපර් සහ වැල් දොඩම් වගා ව්‍යාපෘතිය -**

අදාල කාලය තුලදී බදුල්ල දිස්ත්‍රික්කයේ ආරක්ෂිත ගෘහයන්හි බෙල් පෙපර් වගාව සහ වැල් දොඩම් වගාව සඳහා ආයෝජන ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය මූලික කටයුතු සම්පාදනය කරමින් පවතී.

- **නිපුණතා / ව්‍යවසායකත්ව සංවර්ධන වැඩ සටහන් -**

අදාල කාලය තුලදී අපනයන කළ හැකි භාණ්ඩ, විසිතුරු පැළ සහ මල් වගාව, පසු අස්වනු තාක්ෂණය සහ ඇසුරුම් ක්‍රම, කුරුඳු සැකසීම සහ ව්‍යවසායකත්ව සංවර්ධනය වැඩ සටහන් 05 ක් දිස්ත්‍රික්කයේ ව්‍යවසායකයින් 185 ක ගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී.

3.4 වෙනත් අපනයන සංවර්ධන වැඩ සටහන්

- **විද්‍යුත් වාණිජ්‍ය සේවා -**

මණ්ඩලයේ විද්‍යුත් වාණිජ්‍යය මධ්‍යස්ථානය වන "Tradenetsl" මගින් විද්‍යුත් වාණිජ්‍යය සේවාවන් රැසක් අපනයනකරුවන් වෙත ලබා දෙන ලදී. ප්‍රාදේශියව විසිරී සිටින ව්‍යවසායකයින්ගේ පහසුව සඳහා ප්‍රාදේශිය මට්ටමින්ද එම සේවා ලබා දීමට පියවර ගෙන තිබේ. අදාල කාලය තුලදීවිද්‍යුත් වාණිජ්‍ය සේවා සඳහා නව සාමාජිකයින් 35 ක් ඇතුල් වූ අතර දැනට සුළු සාමාජිකත්වය 1652 ක් වේ. මෙම කාලය තුලදී අන්තර් ජාල සෙවීම් (278), වෙබ් ප්‍රචාරණ (06), වෙබ් අඩවි (07), වෙබ් සබඳතා (06), වෙළඳ තොරතුරු සැපයීම් (118) සහ විද්‍යුත් තැපැල් සේවා (83) ක් ව්‍යවසායකයින් වෙත ලබා දෙන ලදී.

මීට අමතරව, අගලවත්ත, නුවර, ගාල්ල, සෙවනගල, මොණරාගල, අම්පාර, සහ කොළඹ දී විද්‍යුත් වාණිජ්‍යය සේවා පිළිබඳ සම්මන්ත්‍රණ 09 ක් පවත්වනු ලැබීය. අපනයන සංවර්ධන මණ්ඩලයේ නිල වෙබ් අඩවිය වන www.tradenetsl.com තුලින් ක්‍රියාත්මක වාණිජ්‍යය බිහිදොර (Trade Portal) සඳහා දැනට අපනයනකරුවන් 76 ක් ලියාපදිංචි වී ඇති අතර ඒ තුලින් සාර්ථක වෙළඳ ගනුදෙනු 24 ක් සිදු කිරීමට හැකි විය.

- **වෙළඳ තොරතුරු සහ උපදේශක සේවා -**

පරිඝනක වෙළඳ දත්ත පහසුකම්, උපදේශක සේවා, ප්‍රකාශන සහ පුස්තකාල සේවා ආදිය මගින් අපනයනකරුවන්ට විවිධ සේවාවන් මණ්ඩලය මගින් ලබා දෙනු ලැබේ. අදාල කාලය තුලදී 35 කට අධික අන්තර් ජාතික මිල ගණන් සහ 170 ක් සඳහා වෙනත් සංඛ්‍යාලේඛන අපනයන ක්ෂේත්‍රය වෙත ලබා දෙන ලද අතර, 700 දෙනෙකුට පුස්තකාල සේවාවන් සපයන ලදී. මීට අමතරව "දැයට කිරුල", "බෝට්ටු ප්‍රදර්ශනය - 2010", දඹදෙණිය ICT ප්‍රදර්ශනය, කිතුල වරුණ, "FACETS"" Agri Business" SME Machinery Entrepreneur Day "ඉන්ට්‍රාඩ්" ආදී දේශීය ප්‍රදර්ශන රාශියකට මණ්ඩලයේ සහභාගිත්වය සංවිධානය කරනු ලැබීය.

මීට අමතරව මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශිය කාර්යාල මගින් අපනයනකරුවන් සහ අපනයනයට පිවිසීමේ හැකියාව සහිත ව්‍යවසායකයින් 2500 ට වැඩි ප්‍රමාණයකට උපදේශක සේවාවන් ද සපයන ලදී.

- **අපනයන ආශ්‍රිත ප්‍රකාශන -**

මෙම කාලය තුලදී 'Expo News' ප්‍රකාශන 24 ක් සහ අපනයන පුවත්' ප්‍රකාශන 12 ක් පිළියෙල කරන ලදී. මීට අමතරව 'Policy Briefing' තොරතුරු පත්‍රිකා 12 ක් ද පිළියෙල කරන ලදී.

- **අපනයන ප්‍රගති දර්ශකය 2000 - 2009**

ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂේත්‍රය පිළිබඳ සවිස්තරාත්මක සංඛ්‍යා ලේඛන ඇතුලත් මෙම ප්‍රකාශනය මුද්‍රිතව හා සංයුක්ත තැටියක් ලෙසද පිළියෙල කරන ලදී.

- **අපනයනය සඳහා ඇසුරුම් සංවර්ධනය -**

තත්වයෙන් උසස්, විශ්වාස දායක සහ අඩු පිරිවැය ඇසුරුම් ක්‍රම පිළිබඳව අපනයනයට නැඹුරු සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් දැනුවත් කිරීම සඳහා යාපනය ඇතුළු දිස්ත්‍රික්ක ගණනාවක් ආවරණ වන පරිදි වැඩ සටහන් 15 ක් මණ්ඩලයේ ඇසුරුම් මධ්‍යස්ථානය මගින් ක්‍රියාත්මක කරනු ලැබිය. නැවුම් සහ සකස් කල කෘෂි නිමැවුම්, අත්කම් භාණ්ඩ, රෙදිපිළි ආශ්‍රිත නිමැවුම්, සහ නව ඇසුරුම් තාක්ෂණ ආදි විෂයන් මෙම සම්මන්ත්‍රණවලදී ආවරණය විය.

මීට අමතරව සෘජුව හා වක්‍රව අපනයනයේ යෙදෙන ව්‍යවසායකයින් 80 කට පමණ තාක්ෂණික උපදෙස් මෙම කාලය තුලදී ලබා දෙන ලදී.

අදාල කාලය තුල ඇසුරුම් 'කර්මාන්තයේ තොරතුරු' ඇතුලත් අත්පොතක් සහ ඇසුරුම් කර්මාන්තය පිළිබඳ වූ තොරතුරු පත්‍රිකා සංශෝධනය කරන ලදී. පවත්නා මත්ස්‍ය ඇසුරුම්කරණ ක්‍රම සංවර්ධනය කිරීම සඳහා මූලික අවශ්‍යතා අධ්‍යයනයක් සිදු කරන ලදී.

ජනාධිපති සම්මාන උළෙල

2007, 2008 සහ 2009 යන කාලයන් තුලදී අපනයන ක්ෂේත්‍රයට විශිෂ්ට දායකත්වයක් ලබා දුන් අපනයනකරුවන් අගය කිරීම සඳහා ජනාධිපති සම්මාන උළෙලක් අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට කටයුතු යොදා තිබේ.

"දහස් දිරිය" ආයෝජන ප්‍රවර්ධන ව්‍යාපෘතිය -

අගය එකතු කල භාණ්ඩ අපනයනය කරනු ලබන ව්‍යාපාරිකයින්ගේ ප්‍රගතිය ඇගයීම, ඔවුන් අපනයනාභිමුඛ ආයෝජන සඳහා දිරිගැන්වීම යන අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබිය.

අදාල කාලය තුලදී අපනයනකරුවන් දහස් දිරිය ව්‍යාපෘතිය යටතේ කරනු ලැබූ අනුමත ආයෝජනයන් සඳහා රු මිලියන 23.5 ක් ප්‍රතිපූර්ණය කරනු ලැබිය

අගය එකතු කල බදු ගෙවීම පමා කිරීමේ සහ අත්හිටුවීමේ යෝජනා ක්‍රමය (SVAT Scheme)

ඇගළුම් හැර අනිකුත් අපනයන ක්ෂේත්‍රයන් සඳහා මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය ආදායම් බදු පනත යටතේ මණ්ඩලයට පවරා තිබේ. ඒ යටතේ වක්‍ර අපනයනකරුවන් සහ

අපනයනකරුවන් ලියාපදිංචි කිරීම, ඔවුන්ගේ ආනයන / අපනයනයන් සුපරීක්ෂණය, ගනුදෙනු වාර්තා තබා ගැනීම සහ ආදායම් බදු දෙපාර්තමේන්තුවට මාසිකව වාර්තා සැපයීම යන කාර්යයන් මේ යටතේ මණ්ඩලයට පැවරී තිබේ.

දැනට මෙම යෝජනා ක්‍රමය සඳහා ඍජු හා වක්‍ර අපනයනකරුවන් 740 ක් ලියාපදිංචි වී ඇත. 2010 වසරේ අදාල කාලය තුලදී රු. බිලියන 18 පමණ අගය එකතු කල බදු ප්‍රමාණයක් සඳහා බදු පමා කිරීමේ පහසුකම් ලබා දී ඇති අතර එය අපනයනකරුවන්ගේ ද්‍රවශීලතා ප්‍රශ්නයට විශාල සහනයක් වී තිබේ.

අපනයනකරුවන්ට සෙස් බදු ප්‍රතිදානය කිරීම -

අපනයනකරුවන් තම ආනයනික යෙදවුම් මත ගෙවන ලද සෙස් බදු ප්‍රතිදානය කිරීම ඔවුන්ගේ තරඟකාරීත්වය සුරක්ෂිත කිරීමට 2009 සිට ක්‍රියාත්මක කරන වැඩ සටහනකි. දැනට මේ යටතේ අපනයනකරුවන් සිව්දෙනෙකු ලියාපදිංචි වී තිබේ.

වක්‍ර අපනයනකරුවන් සඳහා විදේශීය විනිමය ගිණුම් ඇරඹීමට අවශ්‍ය නිර්දේශ ලබා දීම -

ශ්‍රී ලංකා මහ බැංකුවේ වක්‍ර ක්‍රියාත්මක මෙම යෝජනා ක්‍රමය යටතේ වක්‍ර අපනයනකරුවන්ට, අපනයනකරුවන්ගෙන් විදේශ මුදලින් ලැබෙන ගෙවීම්, විදේශ විනිමය ගිණුමක (IEFCA) තැන්පත් කර තම ආනයනික යෙදවුම් සඳහා යොදා ගැනීමට අවස්ථාව සලසා ඇත. මේ යටතේ මෙම වසර තුලදී නිර්දේශ 3 ක් මණ්ඩලය මගින් වක්‍ර අපනයනකරුවන් තිදෙනෙකුට ලබා දී තිබේ.

උපදේශක සභා පිහිටුවීම -

ප්‍රධාන අපනයන ක්ෂේත්‍ර 20 ක් සහ විශේෂිත අපනයන විෂය ක්ෂේත්‍රයන් සඳහා අපනයන සංවර්ධන පනත යටතේ උපදේශක සභා පිහිටුවීමට මණ්ඩලය පියවර ගෙන තිබේ. අදාල ගැසට් මුද්‍රණය කළ අතර 2011 පළමු කාර්තුවේදී උපදේශක සභා හමුවීමට නියමිතය.

උපාය මාර්ගික සැලැස්ම - 2011 - 2015 පිළියෙල කිරීම

2011- 2015 කාලය සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය සඳහා උපාය මාර්ගික සැලැස්මක් උපදේශක සභා නියෝජිතයන්ගේ සහභාගිත්වයද ඇතිව පිළියෙල කර එය 2010 දෙසැම්බර් 06 වන දින ගරු කර්මාන්ත හා වාණිජ කටයුතු ඇමතිතුමාට උත්සවාකාරයෙන් පිරිනමන ලදි

"භාණ්ඩ හා සේවා අපනයනය සංවර්ධනය හා ප්‍රවර්ධනය කිරීමේ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය බවට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය පත් කිරීම, ශ්‍රී ලංකාවේ අපනයනයන්ගේ ජාත්‍යන්තර තරඟකාරීත්වය ඉහළ නැංවීම, භාණ්ඩ හා සේවා

අපනයනයෙන් උපරිම විදේශ විනිමයක් උපයා ගැනීමට කටයුතු කිරීම සහ රජයේ සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට උපරිමව දායක වීම."

යන මෙහෙවරෙන් දිශාගත වූ උපාය මාර්ගික සැලැස්ම 2015 දී ඇමරිකානු ඩොලර් බිලියන 15 ක් දක්වා අපනයන ආදායම ඉහළ නැංවීමට ඉලක්ක කර ඇත

නිපුණතා සංවර්ධන, දැනුවත් කිරීමේ සහ පුහුණු වැඩ සටහන් -

මෙම කාලය තුලදී හොරණ, ත්‍රිකුණාමලය, බණ්ඩාරවෙල, බදුල්ල, අගලවත්ත, කුරුණෑගල, නුවරඑළිය, ගාල්ල, නල්ලූර්, මහනුවර, කළුතර, කොස්ගම, අඹගමුව, මාතලේ, කෑගල්ල සහ කොළඹ යන ප්‍රදේශවලදී නිපුණතා සංවර්ධන වැඩ සටහන් 85 ක් ව්‍යවසායකයින් 3845 ගේ පමණ සහභාගිත්වයෙන් පවත්වන ලදී.

මෙම වැඩ සටහන් මගින් අපනයන වෙළඳ පලට පිවිසීම සහ වෙළඳ පල ප්‍රවණතා, අපනයන විභවයක් සහිත භාණ්ඩ, ඇසුරුම්කරණය, නිෂ්පාදිතයන් ආශ්‍රිත තාක්ෂණික හැකියාවන් වර්ධනය කිරීම සහ අපනයන ක්‍රියාපටිපාටිය පිළිබඳව ව්‍යවසායකයින් දැනුවත් කිරීමට පියවර ගෙන තිබුණි.

අපනයන සංවර්ධන මණ්ඩලය අපනයන / ආනයන ක්‍රියාපටිපාටිය පිළිබඳ විශේෂ පාඨමාලා දෙකක් සංවිධානය කරනු ලැබේ. මෙම වසරේ අදාල කාලය තුලදී 'ආනයන සහ අපනයන ක්‍රියාපටිපාටිය පිළිබඳ "සහතික පත්‍ර" පාඨමාලා 4 ක් සහ "ජාත්‍යන්තර වෙළඳාමේ මෙහෙයුම් කාර්යයන්" පිළිබඳ පාඨමාලා 3 ක් පවත්වන ලදී. මෙමගින් අපනයන ක්ෂේත්‍රයේ නියැලි ව්‍යවසායකයින් 287 කට පමණ අදාල විෂය ක්ෂේත්‍රයන්හි පුහුණුවක් ලබා දීමට හැකිවිය.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2010-12-31 දිනට ශේෂ පත්‍රය

	ප්‍රවර්ථන වර්ෂය 2010 රු ශත	පූර්ව වර්ෂය 2009 රු ශත
වත්කම්		
ජංගම නොවන වත්කම්		
දේපල යන්ත්‍ර හා උපකරණ	53,685,815.14	59,550,760.38
ආයෝජන	324,562,361.00	287,881,201.00
ජංගම වත්කම්		
තොග	1,824,633.91	2,265,189.94
ණයගැතියෝ සහ ලැබියයුතු මුදල්	142,616,039.28	158,881,814.08
මුදල් හා සාමඝයන්	73,776,084.89	4,551,616.91
ප්‍රධාන රේගු රැස්කිරීම්	468,742,448.83	468,742,448.83
	1,065,207,383.05	**981,873,031.14**
හිමිකම් හා වගකීම්		
රජයේ දායකය	7,904,002.00	7,904,002.00
එ ජා ස වැ දායකය	2,110,282.00	2,110,282.00
ෂඕඤ දායකත්වය	12,716.35	12,716.35
අපනයන ප්‍රවර්ධන ලේකම් කාර්යාලය	202,677.32	202,677.32
	10,229,677.67	**10,229,677.67**
රඳවාගත් ඉපැයුම්		
වියදම් ඉක්මවූ ආදායම් අතිරික්තය	922,253,187.13	760,419,525.67
ජංගම වත්කම්		
ණයහිමියෝ සහ උපචිත ගාස්තු	55,991,525.31	136,242,589.30
පාරිතෝශිත සඳහා වෙන්කිරීම්	**72,344,753.48**	**70,588,128.50**
	128,336,278.79	**206,830,717.80**
ශුද්ධ වත්කම් - එක්ස්පෝ ඒකකය	4,388,239.46	4,393,110.00
	1,065,207,383.05	**981,873,031.14**

ජනක රත්නායක
සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි

පී කේ සුමිත්‍රාරච්චි
වැ බ මූලඝ අධඝක්ෂ

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2010-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ආදායම් වියදම් ප්‍රකාශය

	ප්‍රවර්තන වර්ෂය 2010 රු ශත	පූර්ව වර්ෂය 2009 රු ශත
සෙස් ආදායම්	493,750,000.00	414,350,000.00
සෙස් ආපසු ගෙවීම්	55,400,000.00	-
	2,535,733.94	
විවිධ ආදායම්	25,370,105.01	17,677,471.52
ලාභාංශ	15,571,625.75	46,416,186.23
	39,681,160.00	
සම්මන්ත්‍රණ හා පාඨමාලා ගාස්තු	10,809,545.49	12,459,511.89
ජාතික සවිය ගම නැගුම	-	889,730.00
ණය පොලී	2,404,486.37	2,607,207.34
පොත් අලෙවිය	316,621.00	468,541.00
ස්ථාවර වත්කම් අලෙවියෙන් ලද ලාභ ආදායම්	-	-
වෙන්නායි ආදායම්	50,002.24	20,305,453.00
කාබනික නිෂ්පාදන	-	-
	645,889,279.80	**515,174,100.98**

පරිපාලන වියදම්

සේවක පඩිනඩි	139,861,764.17	143,144,337.63
සේ අ ආ සේ හා අ හා විශ්‍රාම වැටුප්	20,729,866.63	28,065,926.72
ගමන් වියදම්	1,030,641.40	1,679,752.12
සැපයුම් අවශ්‍යතා	3,494,581.33	6,239,459.48
වෙනත් සේවා	20,755,771.92	24,868,879.37
ශිෂ්‍යත්ව පුහුණු හා වෙනත්	1,409,647.54	1,804,037.73
කාර්යාල උපකරණ අළුත්වැඩියාව හා නඩත්තුව	1,593,673.65	1,273,029.88
ගෙවල් කුලී	47,539,332.23	47,292,330.90
ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය	6,624,963.66	9,196,519.94
රථවාහන අළුත්වැඩියාව හා නඩත්තුව	5,975,377.29	7,006,769.26
පුද්ගලික කුලී වියදම්	4,370,051.26	2,491,479.85
සන්නිවේදන හා සාමාජික මුදල්	6,930,480.80	7,381,577.68
ක්ෂය සඳහා වෙන්කිරීම්	8,809,011.64	9,388,497.00
	269,125,163.52	**289,832,597.56**

	ප්‍රවර්තන වර්ෂය 2010 රු ශත	පූර්ව වර්ෂය 2009 රු ශත
අපනයන සංවර්ධන වියදම්		
අපනයන කෘෂිකර්ම අංශය	105,726,182.74	58,706,277.67
යුරෝපා කාබනික කෘෂිකර්ම ව්‍යාපෘතිය	5,694,429.69	7,211,887.22
අලෙවිකරණ අංශය	44,605,469.36	29,594,988.91
ශ්‍රී ලංකා වෙළඳ මධ්‍යස්ථානය -චෙන්නායි	-	44,270,923.92
ප්‍රතිපත්ති හා සැලසුම් අංශය	3,023,482.90	139,954.07
නිෂ්පාදන කළමනාකරණ අංශය	18,464,752.94	34,915,450.32
සේවා අංශය	2,245,110.01	2,480,757.37
සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධන අංශය	8,474,023.05	11,280,373.75
වෙළඳ තොරතුරු සේවා අංශය	4,744,062.28	8,464,030.29
ට්‍රේඩ්නෙට් අංශය	6,890,543.54	2,275,793.82
අපනයන දිරි දීමනා - දහස් දිරිය	6,288,494.10	4,594,862.06
දිරි දීමනා	-	4,742,907.00
ඒකාබද්ධ කෘෂි ආදර්ශ ව්‍යාපෘතිය	12,394,662.70	9,066,151.40
ජ්සසජ ව්‍යාපෘතිය	-	452,966.00
සහල් ආශ්‍රිත නිෂ්පාදන	900,000.00	478,631.87
අන්තර්ජාතික තත්ව සහතික	546,128.00	1,192,320.00
සෙස් ආපසු ගෙවීම්	1,494,950.03	-
	221,492,291.34	**219,868,275.67**
මුළු වියදම්	**490,617,454.86**	**509,700,873.23**
වියදම් ඉක්මවූ ආදායම් අතිරික්තය	**155,271,824.94**	**5,473,227.75**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
2010-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2009 රු 000	**මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය**		2010 රු 000
5,473	**වියදමට වැඩි ආදායම**		155,272
	ගැලපීම්		
9,389	ක්ෂයවීම	7,951	
12,609	පාර්තෝෂික සඳහා වෙන්කිරීම්	6,015	
	ස්ථාවර වත්කම් විකිනීමෙන් ලද ලාභය/ අලාභය	-	
		-	
(9,414)	පෙර වර්ෂය සඳහා ගැලපුම්	(6,562)	
(46,416)	ලාභාංශ ආදායම	(55,253)	
(2,607)	පොලී ආදායම	(2,404)	
-	මුදල් සංසරණය හා සම්බන්ධ නොවූ ක්‍රියාකාරකම්		
	කල්බදු පොලී		(50,253)
(36,439)			
(30,966)	**කාරක ප්‍රාග්ධන වෙනස්වීම් පෙර මෙහෙයුම් ලාභය**		105,019
555	තොගය (වැඩිවීම)/අඩුවීම		441
857	ණයගැති හා ලැබියයුතු දෑ (වැඩිවීම්)/අඩුවීම්		16,266
-	ණයගැති හා ලැබියයුතු දෑ (වැඩිවීම්)/අඩුවීම් (ප්‍රධාන රැස්කිරීම්)		-
36,278	ණය හිමි හා උපචිත වියදම් වැඩිවීම්/අඩුවීම්		(59,374)
37,690			(42,667)
6,724	**මෙහෙයුම් ක්‍රියාකාරිකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය**		**62,352**
(7,606)	පාරිතෝෂික ගෙවීම		(4,259)
	බදු ගෙවීම්		-
(7,606)			(4,259)
882	**මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ගලාඒම් සහ ගලායාම්**		**58,093**
	ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය		
(3,159)	ස්ථාවර වත්කම් මිලදීගැනීම්		(2,087)
-	ස්ථාවර වත්කම් විකිනීමෙන් ලද මුදල්		-
11,773	ලාභාංශ ආදායම		15,572
(10,553)	බදු කුලී ගෙවීම්		(1,758)
2,607	පොලී ලැබීම්		2,404
668			14,131
(214)	**ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනයවූ ශුද්ධ මුදල් ගලා ඒම් සහ ගලා යෑම්**		**72,224**
	මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය	-	
-	කොටස් ආයෝජනය		
(8,279)	ආයෝජන නිදහස් කිරීම		(3,000)
(8,279)			(3,000)
(8,493)	**වර්ෂය තුල මුදල් හා මුදල් සමාන ශුද්ධ වැඩිවීම/(අඩුවීම)**		**69,224**
13,045	වර්ශය මුල මුදල් හා මුදල් සමාන දෑ		4,552
4,552	**වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ**		**73,776**

සභාපති,

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමගස ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් දූමම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2011 දෙසැම්බර් 23 දින සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුලත් වේ.

1.3 විගණන විෂය පථය හා මතය සඳහා පදනම

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව දූමම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. දූමම වාර්තාවේ ඇතුලත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ

මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තිරණය කිරිම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරි බලතල පැවරේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, දෑමම වාර්තාවේ 2.2 ජේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි දෑමහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතියට යොමුව	අනුකූල නොවීම
(අ) ප්‍රමිති අංක 18	(i) වර්ෂ 05 කට පෙර පාවිච්චියෙන් ඉවත් කර තිබුණු පරිගණක, ලී බඩු, කාර්යාල උපකරණ සහ රූපවාහිනී උපකරණවල වටිනාකම පොත්වලින් කපා හැරීමට හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.
	(ii) වටිනාකම සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද එහෙත් තවම භාවිතා කරන මෝටර් වාහන, ලී බඩු, කාර්යාල උපකරණ

ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබීම.

(iii) වත්කමේ ප්‍රයෝජනවත් ජීව කාලය පදනම් කරගෙන පරිගණක හා පරිගණක උපාංග ක්ෂයවීම් කර නොතිබුණි.

(iv) රු.11,494,648 ක් වූ බදු දේපල වැඩිදියුණු කිරීම වෙනුවෙන් කල ප්‍රාග්ධන වියදම්, බදු ගිවිසුම් කාලය තුල ලියා හැරීම සඳහා බදු දේපල ක්ෂය ප්‍රතිපත්ති සැලසුම්කර ක්‍රියාත්මක කර නොතිබීම.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පරිගණක මෘදුකාංග, රූපවාහිනී උපකරණ සහ ලි බඩු හා කාර්යාල උපකරණ යනාදී ස්ථාවර වත්කම්වල සමාලෝචිත වර්ෂයේ ක්ෂයවීම් පිළිවෙලින් රු.41,634 ක් අඩුවෙන්ද, රු.17,008 ක් වැඩියෙන්ද, රු.276,160 ක් අඩුවෙන්ද ගිණුම්ගත කර තිබුණි.

(ආ) 2005 වර්ෂයේදී කල්බදු ක්‍රමය යටතේ මිලදී ගත් එකතුව රු.32,750,000 ක් වූ මෝටර් වාහන 10 ක් 2006 වර්ෂයේදී ක්ෂයකර නොතිබීම නිසා මෝටර් වාහන ක්ෂයවීම් රු.3,353,600 ක් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ඇ) මණ්ඩලයේ ආශ්‍රිත සමාගමක් වන "ඩිවොලොප්මන්ට් හෝල්ඩින්ග්ස්" සමාගමේ කොටස්වල කළ ආයෝජන ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) ආශ්‍රිත සමාගමේ නොබෙදා සමුච්චිත වී තිබුණු රඳවාගත් ලාභ තිබියදීත් 2000 සිට 2005 සහ 2007 යනාදී වර්ෂ 07 කදී ආයෝජනයේ ධාරන වටිනාකමේ වැඩිවීම ගිණුම් ගත කර නොතිබුණි.

(ii) සමාගමේ 2010 දෙසැම්බර් 31 දිනට රු.1,004,166,781 ක්වූ රඳවා ගත් ලාභ මත ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති 27 පරිදි ආයෝජනයේ ධාරන වටිනාකම වැඩිවීම් රු.411,708,380 ක් ගිණුම්ගත කළ යුතු වුවද, ගිණුම්ගත කර තිබුණේ රු. 232,277,411 කි.

(iii) මේ අනුව ආයෝජනයේ ධාරන වටිනාකම වැඩිවීම ගිණුම්ගත කිරීම පිළිබඳ ගිණුම් ප්‍රතිපත්ති ඒකාකාරීව, අඛණ්ඩව හා නිරවද්‍ය ලෙස අනුගමනය කර නොතිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය.

(iv) මණ්ඩලය ආදායම් බදුවලින් නිදහස් කර ඇති බැවින් සමාගදූමන් 2007 සිට 2009 දක්වා වූ කාලපරිච්ඡේදය තුල මණ්ඩලයට ලැබුණු රු.36,244,971 ක් වූ ලාභාංශවලින් රැඳවුම් බදු අඩුකළ නොහැකි වුවත්, සමාගම රු.3,624,498 ක් රැඳවුම් බදු අය කිරීම නිසා ලාභාංශ ආදායම් අඩුවෙන් ලැබී තිබුණු අතර, එම ලැබිය යුතු රු.3,624,498 ක්වූ ලාභාංශ ආදායම් අයකර ගැනීමට හා ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 1998 වර්ෂයේදී තැන්පත් කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය වන විටත් ගිණුම්ගත කර නොතිබුණු රු.1,154,000 ක්වූ ස්ථාවර තැන්පතුවක් සඳහා සමාලෝචිත වර්ෂයේදී ආපසු මුදල් ලබා ගෙන වෙනත් ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඉ) අපනයන ප්‍රවර්ධන වැඩසටහන් හා විවිධ සේවාවන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂවලදී ගෙවීම් කර තිබුණු රු.1,842,403 ක් වූ අත්තිකාරම් 15 කට අදාල සේවා ලැබී තිබුණු නිසා එම අත්තිකාරම් පියවීම් කර අදාල වියදම් ගිණුම් ගත කරනු වෙනුවට, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අත්තිකාරම් ලෙස දක්වා තිබුණි.

(ඊ) විවිධ අපනයන ප්‍රවර්ධන වැඩසටහන් යටතේ පෞද්ගලික සමාගම් කොටස්වල ආයෝජන රු.156,848,566 ක් වූ අතර එහි වටිනාකම් හීනවීමේ අවදානම සලසා තිබුණු ප්‍රතිපාදනය රු.159,838,617 ක් විය. මේ අනුව ආයෝජන වටිනාකමද ඉක්මවා, වටිනාකම හීනවීමේ අවදානම සඳහා රු.2,990,051 ක ප්‍රතිපාදන වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි.

2.2.3 නොසැසඳු පාලන ගිණුම්

අපනයනකරුවන් සඳහා ක්‍රියාත්මක කළ ණය වැඩසටහන් යටතේ ගෙවූ ණය වලින් 2010 දෙසැම්බර් 31 දිනට හිගහිට තිබුණු ශේෂය ගිණුම් අනුව රු.46,655,856 ක් වුවද, ඉදිරිපත් කර තිබුණු ණය උපලේඛන අනුව රු.45,587,690 ක් විය. ඒ අනුව, රු.1,068,166 ක් වූ ශේෂ වෙනස්කම් සැසඳුම් කර නිරවුල් කර නොතිබුණි.

2.2.4 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලැබිය යුතු ගිණුම්

(i) අපනයනකරුවන්ට ගෙවූ ණය වලින් 2009 දෙසැම්බර් 31 දිනට හිගහිට තිබුණු රු.46,737,356 ක් වූ ණය ශේෂ වෙනුවෙන් රු.57,159,274 ක් එනම්, රු.10,421,917 ක් වැඩියෙන් බොල් ණය ප්‍රතිපාදන සලසා තිබුණද ඉන් අපනයනකරුවන් 07 දෙනෙකු විසින් හිගහිටි ණය ගෙවමින් පවතින

බව නිරීක්ෂණය විය. එසේ ගිණුම්වල වැඩියෙන් වෙන්කල රු.10,421,918 ක් වූ බොල් ණය ප්‍රතිපාදන මුදල, සමාලෝචිත වර්ෂයේදී ගිණුම්වලින් කපාහැර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 05 කට වැඩි කාලපරිච්ඡේදයක් තුල සමුච්චිත වී තිබුණු රු.65,287,697 ක් වූ ලැබිය යුතු එකතු කළ අගය මත බදු (ඩීඹ) ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, එම ගිණුම් ශේෂ වර්ෂ 05 කට වැඩි කාලයක් තිස්සේ සැසඳුම් නොකර ගිණුම්වල දැක්වුණි.

(ii) ඉන්දියාවේ චෙන්නායි ශ්‍රී ලංකා වෙළඳ මධ්‍යස්ථානයේ වෙළඳසැල් 07 කින් අයවිය යුතු කඩකුලී රු.9,510,139 ක් හා විදුලිය ගාස්තු රු.2,637,383 ක් වශයෙන් එකතුව රු.12,147,522 ක් හිගහිට වර්ෂ 2 සිට 4 ක කාලයක් ඉකුත් වී තිබුණද අයකර ගෙන නොතිබුණි.

(iv) අපනයන කෘෂි කලාප වැඩසටහනේ අම්පාර දිස්ත්‍රික්කයේ අන්නාසි වගා ව්‍යාපෘතියේ මුරුසි අන්නාසි මොරෙයියන් 1,200,000 ක් මිලදී ගැනීම් කොන්ත්‍රාත්තුව සඳහා රු.4,500,000 ක අත්තිකාරම් මුදලක් 2009 දී ගෙවා තිබුණද, ඉන් සපයා තිබුණේ අන්නාසි මොරෙයියන් 174,401 ක් පමණි. ඒ අනුව ගිවිසුම් කොන්දේසි කඩ කිරීම සහ 2010 දෙසැම්බර් 31 දින වනවිට ගිවිසුම් කාලය ඉකුත් වීම නිසා අයකරගත යුතු රු.3,191,993 ක්වූ ඉතිරි අත්තිකාරම් මුදල 2011 අපරේල් 30 දින වන විටද පියවීම් නොකල අත්තිකාරම්, ගිණුම්වල දැක්වුණි.

(v) අපනයන කෘෂි කලාප වැඩසටහනේ හම්බන්තොට වීරවිල එළවළු හා පළතුරු වගා ව්‍යාපෘතියේ කාර්යයන් 04 ක් ඉටු කිරීම සඳහා හම්බන්තොට දිස්ත්‍රික් ලේකම්වරයාට ගෙවූ රු.3,857,360 ක් වූ අත්තිකාරම් මුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වැය කර තිබුණද, අත්තිකාරම් පියවා, වියදමට ගිණුම්ගත කර නොතිබුණි.

(vi) අපනයන කෘෂි කලාප වැඩසටහනේ මන්නාරම මිරිස් වගා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන ලේකම්වරයාට හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට ගෙවූ අත්තිකාරම් මුදලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද පියවා නොමැති අත්තිකාරම් ශේෂ පිළිවෙලින් රු.1,535,572 ක් හා රු.250,000 ක් විය.

(ආ) ගෙවිය යුතු ගිණුම්

ගිණුම් 04 ක වර්ෂ 5 කට වැඩි කාලපරිච්ඡේදයක් තුල සමුච්චිත වි තිබුණු රු.5,359,837 ක් වූ ණයහිමි ශේෂ ගෙවා නිදහස් කිරීමට හෝ ගැලපුම් කර නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් පියවර ගෙන නොතිබුණි.

2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතුව රු.481,400,978 ක්වූ පෞද්ගලික සමාගම් කොටස්වල ආයෝජන, එකතුව රු.46,655,856 ක්වූ අපනයනකරුවන්ගෙන් ලැබිය යුතු ණය, එකතුව රු.83,113,243 ක්වූ විවිධ ණයගැතියන් හා ලැබිය යුතු මුදල්, එකතුව රු.52,972,310 ක්වූ විවිධ ණය හිමියන්, එකතුව රු.2,035,247 ක් වූ තානාපති කාර්යාල ලැබිය යුතු එකතු කළ අගය මත බදු හා එම බදු ගිණුම්වලින් කල එකතුව රු.3,476,280 ක් වූ වියදම් යනාදී වත්කම් හා වගකීම් ගිණුම් ශේෂවලට අනුරූපි ආයෝජන ලේඛන, ණය ලේඛන, ණය ලෙජර, ණයගැති ලේඛන, ණයගැති ලෙජර, ණයහිමි ලේඛන, ණයහිමි ලෙජර, විස්තරාත්මක උපලේඛන, ශේෂ තහවුරු කිරීම්, බැංකු ගිණුම් ප්‍රකාශන, ගෙවීම් වවුචර්, ඉන්වොයිසි, වියදම් වාර්තා සහ තොරතුරු ඇතුළත් ලිපිගොනු ඉදිරිපත් නොකිරීම නිසා එම විෂයයන් සතුටුදායක ලෙස සත්‍යක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකිවිය.

(ආ) මණ්ඩලයේ ආශ්‍රිත සමාගමක් වන ණී ඩිවොලොප්මන්ට් හෝල්ඩින්ග්ස් ණී සමාගම විසින්, මණ්ඩලයේ පාවිච්චිය සඳහා ලබා දුන් රු.8,356,005 ක් වූ ලී බඩු ඒකක 1656 ක්, ස්ථාවර වත්කම් යටතේ ලී බඩු හා කාර්යාල උපකරණ ලෙස ගිණුම්ගත කර තිබුණි. එම ස්ථාවර වත්කම්වල අයිතිය මණ්ඩලයට ලැබී ඇති බවට තහවුරු කිරීම සඳහා වූ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

(ඇ) වර්ෂ 05 කට වැඩි කාලපරිච්ඡේදයක සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම එකතුව රු.2,624,250 ක්වූ වත්කම්, ගිණුම් 2 ක හා එකතුව රු.16,772,881 ක්වූ වගකීම්, ගිණුම් 04 ක් ශේෂ වී තිබුණු අතර එම පැරණි ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. එම ගිණුම් ශේෂ පිළිබඳ පැහැදිලි කිරීම් හා ඒවාට අදාල ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොකෙරුණු අතර එම ගිණුම් ශේෂයන් නිරවද්‍ය බවට තහවුරු කළ නොහැකි විය.

(ඈ) ආපසු ගෙවිය යුතු තැන්පත්, අපනයනකරුවන්ගේ දායකය හා EU-EPV Sales Control යනාදී වගකීම් ගිණුම් ශේෂවල පිළිවෙලින් රු.680,565 ක් රු.1,833,757 ක් හා රු.10,403,689 ක් වශයෙන් එකතුව රු.12,918,011 ක්වූ අසාමාන්‍ය හර ශේෂයන්ද, විදේශ ගමන් ණයගැතියෝ වත්කම් ගිණුම් ශේෂයේ රු.458,757 ක් වූ අසාමාන්‍ය බැර ශේෂයන් දැක්වුණු අතර ඒවා පිළිබඳ පැහැදිලි කිරීම් ඉදිරිපත් නොකෙරිණි. ගනුදෙනු සාවද්‍ය ලෙස ගිණුම්ගත කර තිබුණු බව ඉන් නිරීක්ෂණය විය.

(ඉ) ගිණුම් ගැලපීම් හා අත්තිකාරම් පියවීම සඳහා වූ ජර්නල් සටහන් 720 ක් මගින් වියදම්, ආදායම්, වත්කම්, වගකීම් හා සමුච්චිත අතිරික්තය යනාදී ගිණුම් ශේෂයන්ට පිළිවෙලින් කළ රු.59,380,031 ක්, රු.519,400,884 ක්, රු.2,688,387 ක්, රු.11,643,121 ක් හා රු.5,992,846 ක් ගිණුම්ගත කිරීම් සඳහා වූ ඊට අදාල ජර්නල් සටහන් සහතික කර නොතිබුණි. තවද ගිණුම්ගත කිරීම පිළිබඳ ප්‍රමාණාත්මක තොරතුරු හා ගිණුම් ගත කළ වටිනාකම තහවුරු කිරීම සඳහා වූ සාක්ෂි ජර්නල් සටහන් සංලක්ෂ්‍යයෙන් බොහෝ අවස්ථාවලදී හෙළිදරව් කර නොතිබුණු අතර ඒවා පිළිබඳ පැහැදිලි කිරීම්ද ඉදිරිපත් නොකෙරුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාලව නිකුත් කළ එකතුව රු.903,243,571 ක් වූ විගණන විමසුම් 16 ක් සභාපතිවරයා වෙත යවා 2011 ඔක්තෝබර් 14 දින වනවිටත් මාස 03 සිට 09 දක්වා කාලයක් ගත වී තිබුණද, පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

2.2.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම
(අ) 1979 අංක 40 දරණ අපනයන සංවර්ධන පනතේ 2 (1) වගන්තිය	අපනයන සංවර්ධන වැඩසටහන් හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට වගකිව යුතු වන ජනාධිපතිවරයා සහ අමාත්‍යවරුන්ගෙන් සැදුම්ලත් ජාතික සංවර්ධන සභාව 1992 වර්ෂයේ සිට 2010 දක්වා වූ වර්ෂ 19 ක් තුලදීම රැස්වී නොතිබුණි.
(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක ඩීඑම්එස්/ඒ2/ඊඩීබී හා 2006 නොවැම්බර් 30 දිනැති චක්‍රලේඛයේ ඩස ඡේදය	චක්‍රලේඛයේ විධිවිධාන පරිදි මණ්ඩලයේ බඳවා ගැනීම් හා උසස් කිරීම් පටිපාටිය ප්‍රතිශෝධනය කර, ප්‍රතිශෝධිත පරිපාටිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.
(ඇ) භාණ්ඩාගාර ලේකම්ගේ 2002 නොවැම්බර් 02 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන චක්‍රලේඛය සහ මු.රෙ. 350 හා 357	වටිනාකම රු.140,186,137 ක් වූ ස්ථාවර වත්කම් සමාලෝචිත වර්ෂයේදී සමීක්ෂණය කර නොතිබුණු අතර, 2009 වර්ෂයේ වත්කම් සමීක්ෂණ මණ්ඩල වාර්තාවද ඉදිරිපත් නොකෙරිණි.

2.2.7 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කාර්යාලීය රාජකාරි සඳහා එක් එක් අංශයන්ට අනුයුක්ත කර තිබුණු වාහන 09 ක්, කාර්යාලීය රාජකාරිවලින් බැහැරව නිවසට යාම් ඊම් හා පෞද්ගලික ගමන් සඳහාද ධාවනයට යොදාගෙන, 2003 ජුනි 02 දිනැති අංක ජෑ/12 දරන රාජ්‍ය ව්‍යාපාර සහ 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව වෙන් කල නිල වාහන ලෙස මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් විසින් පාවිච්චි කර

තිබුණු අතර 2009 ජුලි සිට 2010 ජුනි දක්වා වූ වර්ෂය තුල එම වාහන 07 ක ධාවනය සහ මණ්ඩලය විසින් දැරූ ඉන්ධන වියදම් පිළිබඳ පහත නිරීක්ෂණයන් විය.

(i) කාර්යාලීය කටයුතු සඳහා ලබා දී තිබූ වාහන පෞද්ගලික ගමන් සඳහා කිලෝමීටර් 86,878 ක් ධාවනය කර, ඒ වෙනුවෙන් රු.1,155,396 ක් මණ්ඩලය විසින් වැය කර තිබුණි. එය මුළු ඉන්ධන පිරිවැයෙන් 63% ක් විය.

(ii) ඊට අමතරව නිවසේ සිට කාර්යාලය දක්වා යාම්ඊම් සඳහා කුලී වාහන පාවිච්චි කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී පමණක් කුලී වාහන වෙනුවෙන් රු.46,065 ක් ගෙවා තිබුණි.

(iii) පෞද්ගලික ගමන් සඳහා වාහනය ධාවනය කල රියදුරන්ගේ අතිකාල හා සංයුක්ත දීමනාද ගෙවා තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේදී රු.6,385,605 ක් වැයකර නිවස හා කාර්යාලය අතර යාම්ඊම් සඳහා මණ්ඩලයේ නිලධාරීන්ට ලබාදී තිබුණු පොදු ප්‍රවාහන පහසුකම් පාවිච්චි නොකර නිවසට යාම් ඊම් සඳහා අධ්‍යක්ෂවරුන් වෙන් වෙන් වශයෙන් වාහන පාවිච්චි කර තිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ආ) ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ව්‍යවසායක සමාගම විසින් නිෂ්පාදන ක්ෂේත්‍රයේ ආයෝජන සඳහා වැයකර, වියදම් වාර්තා හා ලිඛිත සාක්ෂි ඉදිරිපත් කිරීදමන් පසු, ඉන් 50% ක කොටසක් ප්‍රතිපූර්ණයක් ලෙස මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රදානයන් ලබා දීම ඒකාබද්ධ කෘෂි ආදර්ශ වැඩසටහනේ අනුමත කල මූල්‍යාධාර ගෙවීමේ පිලිවෙත වුවත්, ඊට පටහැනිව වියදම් දැරීමට ප්‍රථම ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ව්‍යවසායක සමාගමක් වෙත රු.2,000,000 ක්වූ අත්තිකාරමක් 2007 වර්ෂයේදී ගෙවා තිබුණි. එම අත්තිකාරම් නිෂ්පාදන ක්ෂේත්‍රයේ ආයෝජනය කල බවට, වියදම් වාර්තා හා සාක්ෂි ලබා ගැනීමට හෝ ගෙවූ අත්තිකාරම් ආපසු අයකර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

3. මූල්‍ය හා දමහෙයුම් සමාලෝචනය

3.1 මූල්‍ය සමාලෝචනය

3.1.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මුළු ආදායම සහ වියදම පිළිවෙලින් රු.645,889,280 ක් සහ රු.490,617,455 ක් වූ අතර, ඊට අනුරූපීව පසුගිය වර්ෂයේ මුළු ආදායම සහ වියදම පිළිවෙලින් රු.515,174,101 ක් සහ රු.509,700,873 ක් විය. ඒ අනුව, මණ්ඩලයේ වැඩ කටයුතුවලින් සමාලෝචිත වර්ෂයේදී රු.155,271,825 ක් හා ඉකුත් වර්ෂයේදී රු.5,473,228 ක අතිරික්තයක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල සමාලෝචිත වර්ෂයේදී රු.149,798,597 ක අතිරික්තයේ වැඩිවීමක් පෙන්නුම් කෙරේ. 2010 වර්ෂයේදී සංවර්ධන වියදම් රු.1,624,015 කින් වැඩි වුවද රු.130,715,179 කින් ලැබීම් වැඩිවීම හා පරිපාලන වියදම් රු.20,707,433 කින් අඩු වීම මේ සඳහා බලපා තිබුණි.

3.1.2 විග්‍රහාත්මක මූල්‍ය විශ්ලේෂණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂයට අදාල වියදම් නිරවද්‍ය ලෙස ගිණුම් ගත කර නොමැතිව, ඒවා ගිණුම්ගත කිරීම පිලිබඳ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති අංක 10 විධිවිධානයන්ගෙන් බැහැරවී, පසු වර්ෂවලදී සමුච්චිත අතිරික්තයට / ඌනතාවයට පෙර වර්ෂ ගැලපීම් ලෙස ගිණුම්ගත කිරීම සිරිතක් ලෙස කර තිබුණි.

(ආ) මේ නිසා එම වර්ෂයන්හි මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කල මූල්‍ය ප්‍රතිඵල අසාමාන්‍ය හා ප්‍රතිවිරුද්ධ ලෙස වෙනස්වීදූමන් මූල්‍ය ප්‍රතිඵල කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂ 03 ක මූල්‍ය ප්‍රතිඵල කෙරෙහි අහිතකර බලපෑම පිලිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(i) 2009 වර්ෂයේදී රු.5,473,227 ක් වූ අතිරික්තය, සමාලෝචිත වර්ෂයේදී කල රු.6,561,836 ක් වූ ගැලපීම් වලින් පසු ඊට ප්‍රතිවිරුද්ධ ලෙස රු.1,088,609 ක ඌනතාවයක් වී තිබුණි.

(ii) 2008 වර්ෂයේදී රු.17,318,705 ක්වූ අතිරික්තය, 2009 වර්ෂයේදී කල රු.9,414,273 ක් වූ ගැලපීම් වලින් පසු රු.7,904,432 ක් දක්වා අඩුවී තිබුණි.

(iii) 2007 වර්ෂයේදී රු.174,341 ක්වූ ඌනතාවය, 2008 වර්ෂයේදී කල රු.3,301,661 ක්වූ ගැලපීම් වලින් පසු ඊට ප්‍රතිවිරුද්ධ ලෙස රු.3,127,320 ක අතිරික්තයක් වී තිබුණි.

3.2 මෙහෙයුම් සමාලෝචනය

3.2.1 කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ වැඩසටහන් හා ව්‍යාපෘති යටතේ වූ කාර්ය සාධනය පිලිබඳ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ අයවැය යෝජනා වැඩසටහන්

(i) ඒකාබද්ධ කෘෂි ආදර්ශ වැඩසටහන

2005 රජයේ අයවැය යෝජනා අනුව, වැඩසටහන යටතේ ව්‍යාපෘති 100 ක් රු. මිලියන 500 ක ප්‍රතිපාදන මත 2008 දෙසැම්බර් 31 දින වන විට ක්‍රියාත්මක කර අවසන් කිරීමට ඉලක්ක ගත කර තිබුණු අතර වැඩසටහනේ ඉලක්ක කළ ව්‍යාපෘති කාර්යයන් සම්පූර්ණ කර නොතිබීම

නිසා වැඩසටහනේ කාලය 2010 දෙසැම්බර් 31 දින දක්වාත් දීර්ඝ කර තිබුණද, ආරම්භ කර තිබුණේ ව්‍යාපෘති 22 ක් පමණි. එයින්ද ඉලක්කගත ප්‍රවර්ධනය සාක්ෂාත් කරගෙන තිබුණේ ව්‍යාපෘති 04 ක පමණි. එසේම රජය සහ ව්‍යවසායකින් රු. මිලියන 500 බැගින් ආයෝජනය කිරීමට සැලසුම් කර තිබුණද, ඒ සඳහා ආයෝජනය කර තිබුණේ පිළිවෙලින් රු. මිලියන 69 සහ රු.මිලියන 151 ක් පමණි.

(II) අපනයන කෘෂි කලාප වැඩසටහන

(i) හම්බන්තොට - වීරවිල එළවළු හා පළතුරු වගා ව්‍යාපෘතිය

----

* පිරිවැය වටිනාකම රු.මිලියන 8 ක ප්‍රතිපාදන මත සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළමු අදියර යටතේ අක්කර 15 ක වගා ස්ථාපන කටයුතු සහ මූලික හා යටිතල පහසුකම් සැපයීම් කටයුතු අවසන් කිරීමට ඉලක්ක කර තිබුණු ව්‍යාපෘතියේ, වගා ස්ථාපනය කර තිබුණේ අක්කර 06 ක පමණි.

* ජල තටාකය, විදුලි වැට ඉදිකිරීම් කටයුතු ගොවිපල සඳහා ගොඩනැගිලි, මාර්ග පද්ධතිය ඉදිකිරීම යනාදී යටිතල පහසුකම් සැලසීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි.

* මේ අනුව ඉලක්කගත කාලය තුලදී ව්‍යාපෘති කටයුතු සම්පූර්ණ කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදනය කල රු. මිලියන 1.5 ක් උපයෝජනය කර නොතිබුණි.

(ii) අම්පාර දිස්ත්‍රික්කයේ අන්නාසි වගා ව්‍යාපෘතිය

----

* සමාලෝචිත වර්ෂයේ ජූනි 30 වන විට අක්කර 200 ක වගා ස්ථාපන කටයුතු සම්පූර්ණ කිරීමට ව්‍යාපෘති සැලසුම් අනුව ඉලක්ක ගත කර තිබුණද, වගා ස්ථාපනය කර තිබුණේ අක්කර 44 ක පමණි. අන්නාසි මොරෙයියන් සපයා නොතිබීම ඊට හේතු වී තිබුණි.

* අන්නාසි මොරෙයියන් 1,200,000 ක් සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි 28 දින වන විට සැපයීම් කර අවසන් කළ යුතුව තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් සපයා තිබුණේ මොරෙයියන් 174,401 ක් පමණි.

* ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 16.2 ක් ප්‍රතිපාදනය කර තිබුණද, ව්‍යාපෘති කාර්යයන් ඉටු කිරීමේ දුර්වල

කාර්යසාධනය නිසා උපයෝජනය කර තිබුණේ රු. මිලියන 02 ක් පමණි. එය මුළු ප්‍රතිපාදනයෙන් 12% ක් විය.

(iii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ බිංගිරිය ඇන්තූරියම් මල් හා කැපූ විසිතුරු ශාක පත්‍ර සැකසුම් පැළෑටි වගා ව්‍යාපෘතිය

---

* ඉලක්ක අනුව වර්ෂ 02 ක් තුල කටයුතු ක්‍රියාත්මක කර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සම්පූර්ණ කල යුතු ව්‍යාපෘතියේ පළමු අදියරේ කාර්යයන් යටතේ වූ, කණ්ඩකුවත්ත කෘෂි ආදර්ශ වගා කලාපයේ වගා ආදර්ශන ස්ථාපිත කිරීම, යටිතල පහසුකම් සැපයීම, කෘෂි කලාපය සඳහා සැලසුම් කල නිෂ්පාදන එකතුකිරීමේ, ඇසුරුම් කිරීමේ, අපනයන සැකසුම්, පුහුණු කිරීමේ යනාදී මධ්‍යස්ථාන වෙනුවෙන් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා මූලික කටයුතුවත් ආරම්භ කර නොතිබුණි.

* සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින හෝ ඊට පෙර ඇන්තූරියම් මල් වගාකරුවන්ට පැල 17,000 ක් හා සිඳුමන්ති මල් බදුන් 50,000 ක් සැපයීමට ඉලක්ක ගත කර තිබුණද, එදිනට සපයා තිබුණු පැළ ප්‍රමාණය 4300 ක් පමණක් වූ අතර, සිඳුමන්ති මල් බඳුන් සපයා නොතිබුණි.

* එම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල ඉදිකල දැල් ගෘහ 50 ආශ්‍රිතව ඇන්තූරියම් මල් වගාව ස්ථාපිත කර නොතිබුණු අතර බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල ඉදිකල දැල් ගෘහ 50 ආශ්‍රිතව වගා ස්ථාපනය කලයුතු ඉලක්කයන් අනුව එක් දැල් ගෘහයකට මල් පැල 800 ක් වුවද, ස්ථාපනය කර තිබුණේ 86 ක් පමණි.

* සමාලෝචිත වර්ෂය සඳහා සලසා තිබුණු රු.මිලියන 19.8 ක ප්‍රතිපාදනයෙන් උපයෝජනය කර තිබුණේ රු.මිලියන 9.6 ක් පමණි. එය ප්‍රතිපාදනයෙන් 48% ක් වේ.

(ආ) මණ්ඩලයේ අපනයන ප්‍රවර්ධන හා සංවර්ධන වැඩසටහන්

(i) අපනයන වෙළඳපලවල් ප්‍රවර්ධනය

---

* සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව රු. මිලියන 40.9 ක් ප්‍රතිපාදනය කර තිබුණු යුරෝපය, ඇමරිකාව, අප්‍රිකාව, මැදපෙරදිග, ආසියාතික හා පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් වෙනුවෙන් වූ අපනයන වෙළඳපලවල් ප්‍රවර්ධනය කිරමේ කාර්යයන් 31 කට අදාලව රු.මිලියන 24.1 ක් වූ කාර්යයන් 20 ක් 2011 වර්ෂයට කල් දමා හා ක්‍රියාත්මක කිරීම අත්හිටුවා තිබුණි. ඉතිරි අපනයන වෙළඳපල කාර්යයන් 11 ක මූලික

කටයුතු කිහිපයක් පමණක් ඉටුකර තිබුණු අතර, ඒ සඳහා සලසා තිබුණු 16.8 ක්වූ ප්‍රතිපාදනයෙන්ද උපයෝජනය කර තිබුණේ රු.මිලියන 3.6 ක් පමණකි.

* සමස්ථ භෞතික හා මූල්‍ය කාර්යසාධනය පිළිවෙලින් 56% ක් හා 66% ක් විය.

* තවද, අපනයන වෙළඳපලවල් ප්‍රවර්ධන කාර්යයන් සඳහා විදේශ වෙළඳ ප්‍රදර්ශන හා වෙළඳපලවලට සහභාගිවූ බොහෝ අපනයනකරුවන්ට ඇනවුම් ලැබී නොතිබුණු බව නිරීක්ෂණය වූ අතර, ඒ පිළිබඳ ප්‍රමාණවත් පසුවිපරම් කටයුතුද ක්‍රියාත්මක කර නොතිබුණි.

(II) අපනයන නිෂ්පාදන සැපයුම් සංවර්ධන වැඩසටහන්

----

* සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව කෘෂිකර්ම හා ධීවර, කර්මාන්ත, අපනයන සේවා, අපනයන ඇසුරුම් යනාදී අපනයන නිෂ්පාදන සැපයුම් අංශ යටතේ අපනයන සංවර්ධන වැඩසටහන් 72 ක් සඳහා රු.මිලියන 99.59 ක් වූ ප්‍රතිපාදනයන් කර තිබුණද, ඉන් රු.මිලියන 37.30 ක් වූ වැඩසටහන් 23 ක් අතුරින් රු.මිලියන 4.70 ක් වූ වැඩසටහන් 05 ක් කල්දමා තිබුණු අතර, රු.මිලියන 1.83 ක් වූ වැඩසටහන් 05 ක් ක්‍රියාත්මක කිරීම අත්හිටුවා තිබුණි.

* ඉතිරි වැඩසටහන් 13 ක කටයුතු සමාලෝචිත වර්ෂයේදී ප්‍රමාණවත් පරිදි ඉටුකර සම්පූර්ණ කර නොතිබුණු අතර, ඒ සඳහා සලසා තිබුණු රු.මිලියන 30.80 ක් වූ ප්‍රතිපාදනයෙන් උපයෝජනය කර තිබුණේ රු.මිලියන 0.86 ක් පමණි.

* මේ අනුව, සමස්ථ භෞතික හා මූල්‍ය කාර්යසාධනය පිළිවෙලින් 68% ක් හා 63% ක් විය.

(III) ප්‍රාදේශිය අපනයන සංවර්ධන වැඩසටහන්

----

* බස්නාහිර, දකුණ, මධ්‍යම, වයඹ, උතුරු නැගෙනහිර, ඌව යනාදී ප්‍රාදේශිය කාර්යාල මගින් රු.මිලියන 41.89 ක ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කිරීමට ඉලක්ක කල ප්‍රාදේශිය අපනයන සංවර්ධන වැඩසටහන් 63 ක් අතුරින් රු.මිලියන 25.95 ක ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කල වැඩසටහන් 11 ක ප්‍රමාණවත් කටයුතු ඉටු කර සම්පූර්ණ කර නොතිබීම නිසා ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණේ රු. මිලියන 0.07 ක් පමණි.

* ප්‍රාදේශිය අපනයන සංවර්ධන වැඩසටහන්වල සමස්ථ භෞතික හා මූල්‍ය කාර්යසාධනය පිළිවෙලින් 83% ක් හා 0.28% ක් විය.

(ඇ) මණ්ඩලයේ අරමුණු හා කාර්යයන්වලට අනුව වාර්ෂික දළ දේශීය නිෂ්පාදනයට අපනයන සංවර්ධන මණ්ඩලයේ දායකත්වය කොපමණද යන්න පිළිබඳ නිශ්චය කර නොතිබුණි.

3.2.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ වයඹ පලාත් කාර්යාලය පවත්වනු ලබන ගොනැගිල්ලේ බදු ගිවිසුම් කාලය 2009 මැයි 31 දින අවසාන වී තිබුණද, 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධානයන්ට පටහැනිව, එකඟවූ රු.100,000 ක මාසික කුලියක් ගෙවා, කාර්යාලය සඳහා ප්‍රමාණවත් පහසුකම් නොමැති පැරණි බදු ගොඩනැගිල්ලම පාවිච්චි කර තිබුණි.

(ආ) "දහස් දිරිය", "ඒකාබද්ධ කෘෂි ආදර්ශ", "කෘෂි කලාප" යනාදී අපනයන ප්‍රවර්ධන වැඩසටහන්වල ඉලක්කගත අරමුණු සාක්ෂාත් කර ගැනීම පිළිබඳ ඇගයීම හා සමාලෝචනය සඳහා වූ පසු විපරම් කටයුතු ඉටු කිරීම වෙනුවෙන් නිර්නායක සහ පිලිවෙත් සැළසුම් කර ක්‍රියාත්මක කර නොතිබුණි. මේ නිසා ක්‍රියාත්මක කල වැඩසටහන් වලින් අපනයන ප්‍රවර්ධනය කර තිබුණේද යන්න පිළිබඳ පසු විපරම් කටයුතු සහ එහි කාර්යක්ෂමතාවය, ඵලදායිතාවය ඇගයීම හා සමාලෝචනය ඉටු කිරීම පිලිබඳව සැලකිල්ල නොදක්වා ඉන් බැහැර වී තිබුණි.

(ඇ) බිංගිරිය කෘෂි අපනයන කලාප ව්‍යාපෘතිය යටතේ ඇන්තුරියම් මල් වගා කරුවන් සඳහා සිමෙන්ති මල් බඳුන් 50,000 ක් හා ඇන්තුරියම් මල් පැල 17,000 ක් සැපයීමේ ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක කිරීමේදී විධිමත් නොවීම්, අඩුපාඩු, දීර්ඝ කාල ප්‍රමාදයන් හා කළමනාකරණය කාර්යක්ෂම නොවීම නිසා ඉලක්කගත වර්ෂ 02 ක කාලය තුල එම කාර්යයන් නිම කිරීමට නොහැකි වී තිබුණි.

(ඈ) මණ්ඩලයේ ආශ්‍රිත සමාගමක් වන ඩිවොලොප්මන්ට් හෝල්ඩින්ග්ස් (පෞද්ගලික) සමාගමේ කොටස්වල ආයෝජන සඳහා ලාභාංශ ලබා ගැනීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම පිළිබඳව පහත නිරීක්ෂණයන් විය.

(i) සමාගම 1999 සිට 2006 කාලපරිච්ඡේදය තුල දැමහෙයුම් කටයුතු වලින් ලාභාංශ ගෙවීමට ප්‍රමාණවත් ලාභ උපයාගෙන තිබුණද, මණ්ඩලයේ ආයෝජන සඳහා එම කාලපරිච්ඡේදය තුල ලාභාංශ ලබා ගෙන නොතිබුණු අතර, සමාගමේ ලාභ රඳවා ගැනීමට අවකාශ සලසාදී තිබුණි.

(ii) සමාගම 2007, 2008 සහ 2009 වර්ෂවලදී පිළිවෙලින් රු.8,054,438 ක්, 12,081,657 ක් හා රු.16,108,876 ක් ලාභාංශ ලබාදී තිබුණද, එය ඉහත වර්ෂවල දෙසැම්බර් 31 දිනට රඳවාගත් සමුච්චිත ලාභයේ ප්‍රතිශතයක් ලෙස 0.96% ක්, 1.34% ක් හා 1.70% ක් වශයෙන් ඉතා සුළු ලාභාංශ ප්‍රමාණයක් විය.

(iii) මණ්ඩලයේ ආයෝජන සඳහා ප්‍රමාණවත් ලෙස ලාභාංශ ලබා ගැනීමට කටයුතු නොකර විශාල වශයෙන් ලාභ රඳවා ගැනීමට සමාගමට ඉඩ හැරීම පිළිගත නොහැකි වූ අතර ප්‍රමාණවත් ලෙස ලාභාංශ ලබාගෙන මණ්ඩලයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන්වූ එම අරමුදල් ඵලදායි ලෙස උපයෝජනය කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඉ) 1998 වර්ෂයේදී තැන්පත් කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය වන විටත් ගිණුම්ගත කර නොතිබුණු වටිනාකම රු.1,154,000 ක් වූ ස්ථාවර තැන්පතුවක් සඳහා තැන්පත් මුදල් හා රු.2,535,734 ක් වූ පොලී මුදල් මුදල් සමාලෝචිත වර්ෂයේදී ආපසු ලබා ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) තැන්පතුව වර්ෂ 12 කට වැඩි කාලයක් තිස්සේ ගිණුම්ගත කිරීමටත් තැන්පතුවට අදාල වූ ලිඛිත සාක්ෂි ඇතුළත් ලිපිගොණු හා ලේඛන පැවැත්වීමටත් කටයුතු කර නොතිබුණි.

(ii) ස්ථාවර තැන්පතු පොලිය මත රු.281,748 ක් වූ රැඳවුම් බදු (උපඔ) බැංකුව විසින් අයකර තිබුණු අතර, 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ ෂඩ් කොටසේ 18 වගන්තිය පරිදි මණ්ඩලය බද්දෙන් නිදහස් ව්‍යවස්ථාපිත ආයතනයක් වන නිසා පොලී ආදායම් මත බදු අයකිරීම වළක්වා ගැනීමට හෝ අයකල බදු ආපසු ලබා ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඊ) විවිධ අපනයන ප්‍රවර්ධන වැඩසටහන් යටතේ ස්ථාපනය කල පෞද්ගලික සමාගම් හි කොටස් විෂයෙහි කල රු.156,848,566 ක් වූ ආයෝජන පැවැත්වීම පිළිබඳව පහත නිරීක්ෂණයන් විය.

(i) සමාගම් ස්ථාපිත කර ක්‍රියාත්මක කල අපනයන ප්‍රවර්ධන වැඩසටහන්වලට අදාලව ඉලක්කගත අරමුණු සාක්ෂාත් වීම හෝ අසාර්ථකවීම මත ක්‍රියාකාරීත්වය ඇනහිට අක්‍රියව පවතින සමාගම්වල ගනුදෙනු පියවා, විසුරුවා හැර ආයෝජනය කර තිබුණු මුදල් ආපසු අයකර ගැනීම සඳහා වූ සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) තවමත් ක්‍රියාකාරී තත්ත්වයේ පවතින සමාගම් පිලිබඳව පසු විපරම් කර ක්‍රියාකාරීත්වය පිළිබඳ වාර්තා පැවැත්වීම කර නොතිබුණු අතර, ක්‍රියාකාරී සමාගම්වල ආයෝජන සඳහා ලාභාංශ ලබා ගැනීම සඳහා වූ ක්‍රියාත්මක සැලැස්මක් නොවිය.

(iii) සමාගම් කොටස්වල කල ආයෝජන වටිනාකම හිනවී ඇති බව හා හිනවීම් වටිනාකම විධිමත් ක්‍රියා පිළිවෙත් මත තහවුරු කර නොගෙන වටිනාකම සම්පූර්ණයෙන්ම හිනවීම් වෙනුවෙන් අවිධිමත් ලෙස ප්‍රතිපාදන සලසා තිබුණි.

(උ) ඌව පරණගම හරිතාගාර ව්‍යාපෘතිය යටතේ එළවළු වගාකිරීම සඳහා හරිතාගාර 600 ක් ඉදිකිරීම් වියදම් දැරීම සඳහා ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන අරමුදලෙන් රු.මිලියන 30 ක් 2003 වර්ෂයේදී මණ්ඩලයට ලැබී තිබුණද, ආරම්භ කර තිබුණේ හරිතාගාර 100 ක් පමණකි. ඉතිරි හරිතාගාර 500 ඉදිකිරීම් කටයුතු 2011 අප්‍රේල් 30 වන විටද ඉටු කර නොතිබුණි. කටයුතු සම්පූර්ණ කිරීම සඳහා මණ්ඩලය විසින් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණු අතර, හරිතාගාර 100 ක් ඉදි කිරීම සඳහා ඌව පරණගම ගොවීන්ට ගෙවූ රු. මිලියන 5 සහ එම ණය සඳහා ගිවිසුම්ගත කොන්දේසි ප්‍රකාරව 1% ක සේවා ගාස්තුවක්ද ගෙවීමේ වගකීම මණ්ඩලයට පැවරී තිබුණි.

(ඌ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අංක පීඊඩී/12 හා 2003 ජුනි 02 දිනැති චක්‍රලේඛයේ 7.4.1(ඞ්) ඡේදයේ විධිවිධාන පරිදි 2010 වර්ෂයේදී නිකුත් කර තිබුණු විගණකාධිපතිවරයාගේ විගණන විමසුම් 30 ක් පිළිබඳව, පවත්වා තිබුණු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලදී කමිටුවේ අවධානයට යොමු කොට සාකච්ඡා කර නොතිබුණි.

3.2.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) චෙන්නායි ශ්‍රී ලංකා වෙළඳ මධ්‍යස්ථානයේ කුලියට දී තිබුණු වෙළඳසැල් වලින් ලබා ගත් ආරක්ෂිත තැන්පතු ශේෂය ගිණුම් අනුව රු.625,996 ක් වුවද, හිඟහිටි කඩකුලිවලට හිලව් කිරීම් රු.680,247 ක් හා ආපසු ගෙවීම් රු.305,749 ක් වශයෙන් එකතුව රු.985,996 ක් සමාලෝචිත වර්ෂය තුල ආරක්ෂිත තැන්පතු නිදහස් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් තවදුරටත් කෙරේ.

(i) ආරක්ෂිත තැන්පතු ගිණුම් ශේෂය රු.360,000 ක් ඉක්මවා තැන්පතු නිදහස් කිරීම මතභේදයට තුඩු දුන් අතර, එම වැඩිපුර ගෙවූ මුදල, ණයගැතියන් යටතේ සාවද්‍ය ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ii) එම නිසා රු.360,000 ක්වූ ව්‍යාජ වත්කම් ගිණුම්වල දැක්වුණි.

(ආ) විදේශ වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගිවන අපනයන සමාගම් වෙනුවෙන් මූල්‍යාධාර ලබා දීමේ අනුමත පිළිවෙත් වලින් බැහැරව හා අනුමත මූල්‍යාධාරවලට අමතරව විදේශ වෙළඳ ප්‍රදර්ශනයකට සහභාගී කළ අපනයන සමාගමකට රු.114,400 ක් වූ ණය මුදලක්ද, 2009 ජනවාරි 06 දින ගෙවා තිබුණු අතර, 2011 අප්‍රේල් 30 දින වන විටත් එම ණය ආපසු අයකර ගෙන නොතිබුණි.

3.2.4 අරමුදල් ඌන උපයෝජනය

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) විවිධ කාර්යයන් සඳහා ආරම්භ කර තිබුණු බැංකු ජංගම ගිණුම් 03 කට අදාල කාර්යයන් අවසන් වීදෑමන් පසු ගනුදෙනු පියවීම් කර ඉතිරි වූ රු.1,875,331 ක මුදල් ශේෂ මණ්ඩලයේ කාර්යයන් සඳහා ඵලදායි ලෙස උපයෝජනය කර නොමැතිව වර්ෂ 5 කට වැඩි කාලයක් නිෂ්ක්‍රියව පැවතුණි.

(ආ) මණ්ඩලයේ ක්‍රියාත්මක අපනයන සංවර්ධන වැඩසටහන්වල ව්‍යාපෘති කාර්යයන් වෙනුවෙන් රජයෙන් ලබා දී තිබුණු අරමුදල්වලින් එම ව්‍යාපෘති කාර්යයන් සඳහා උපයෝජනය කර නොගත් රු.70,454,532 ක් වූ අරමුදල් බැංකු ජංගම ගිණුමේ 2010 දෙසැම්බර් 31 දිනට ශේෂ වී තිබුණි. ඉකුත් වර්ෂයේදීද උපයෝජනය කර නොගත් රු.1,965,340 ක් වූ අරමුදල් බැංකු ජංගම ගිණුමේ ශේෂ වී තිබුණි.

3.2.5 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් මණ්ඩලයේ සම්පත්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අංක පීඊඩී/12 හා 2006 ජුනි 02 දිනැති චක්‍රලේඛයේ 8.3.9 ඡේදයට පටහැනිව වෙනත් රාජ්‍ය ආයතනයක් වෙත 2009 නොවැම්බර් 19 දින සිට 2010 ජුනි 30 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළ කුලී වාහන 06 ක් ලබා දී කුලී වාහන ගාස්තු රු.1,689,764 ක් සහ වාහන රියදුරන් සඳහා අතිකාල හා වෙනත් දීමනා රු.92,450 ක් වශයෙන් එකතුව රු.1,782,214 ක් මණ්ඩලය විසින් වැයකර තිබුණි.

(ආ) ඉහත චක්‍රලේඛයට පටහැනිව මණ්ඩලය සතු වාහන 03 ක් සහ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 03 දෙනෙකු අමාත්‍යාංශයේ සේවයට 2007 වර්ෂයේ සිට ලබා දී තිබුණු අතර වාහන නඩත්තු වියදම් සහ කාර්යමණ්ඩල අතිකාල හා සංයුක්ත දීමනා සඳහා පිළිවෙලින් රු.2,166,275 ක් සහ රු.987,176 ක් වශයෙන් එකතුව රු.3,153,451 ක් සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය විසින් වැයකර තිබුණි.

3.2.6 හඳුනාගත් පාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පිහිටුවීමට සැලසුම් කර තිබූ නමුත් ස්ථාපිත කිරීමට නොහැකි වූ ත්‍රිකුණාමලයේ ප්‍රාදේශීය කාර්යාලය සඳහා 2006 වර්ෂයේදී මිලදී ගත් වටිනාකම රු.80,000 ක් වූ වායු සමීකරණ යන්ත්‍රය කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය තුල වර්ෂ 04 කට

වැඩි කාලයක් නිශ්ක්‍රියව තිබීම නිසා ක්‍රියාවිරහිත තත්ත්වයට පත්ව සමාලෝචිත වර්ෂයේදී ඉවත් කර තිබුණි.

(ආ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටුවන ලද බටඅත කර්මාන්ත ව්‍යාපෘතියේ සම්භාණ්ඩ කර්මාන්ත ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා ස්ථාපිත කර තිබුණු නීබ්ඔ(ජඩ්ඔ) බඔෘණී හි සාමාන්‍ය කොටස්වල මණ්ඩලය විසින් 1999, 2000 සහ 2005 වර්ෂවලදී එකතුව රු.1,000,000 ක් ආයෝජනය කර තිබුණද, ව්‍යාපෘති කටයුතු ආරම්භ කිරීම අත්හැර දමා තිබූ නිසා සමාගමේ කටයුතු ආරම්භක අවස්ථාවේදීම අක්‍රිය වී තිබුණි. එම ආයෝජන සඳහා නියමිත කොටස් සහතිකද මණ්ඩලයට ලැබී නොතිබුණි.

(ඇ) ඉන්දියාවේ චෙන්නායි ශ්‍රී ලංකා වෙළඳ මධ්‍යස්ථානයේ වෙළඳසැල් 03 කින් වර්ෂ 02 සිට 06 දක්වා කාලයකට අදාල අයවිය යුතු කඩකුලී රු.2,026,887 ක් හා විදුලිය ගාස්තු රු.312,289 ක් වශයෙන් එකතුව රු.2,339,176 ක් අයකර ගැනීමට නිසි ක්‍රියා මාර්ග නොගැනීම නිසා එම මුදල් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඈ) මණ්ඩලයේ මෝටර් වාහන 08 ක, සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂවල සිදුවූ අනතුරු 13 ක් සඳහා ගිණුම්ගත කර තිබුණු ලැබිය යුතු රක්ෂණ වන්දි මුදලෙන් අයකරගෙන නොතිබුණු රු.373,188 ක් සමාලෝචිත වර්ෂයේදී වාහන අලුත්වැඩියා හා නඩත්තු වියදමට ගිණුම්ගත කර කපාහැර තිබුණි.

3.2.7 ප්‍රසම්පාදන කොන්ත්‍රාත්තු පරිපාලනය

(අ) අම්පාර දිස්ත්‍රික්කයේ අන්නාසි වගා ව්‍යාපෘතිය සඳහා මොරෙයියන් මිලදී ගැනීම - රු.9,000,000

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.12, 5.3.11, 6.2, 6.3.1 හා 6.3.6 විධිවිධාන පරිදි ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක නොකර, විධිමත් නොවූ ලෙස ලැබී තිබූ එකම ලංසුව සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.

(iii) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 මාර්ගෝපදේශ විධිවිධානවලට පටහැනිව කොන්ත්‍රාත්තු වටිනාකදූමන් 50% ක් වන රු.4,500,000 ක් අත්තිකාරම් ගෙවා තිබුණි. ඒ සඳහා කාර්යසාධන සුරක්ෂණයක්දු ලබා ගෙන නොතිබුණි.

(iii) ගිවිසුම් කොන්දේසි අනුව වරකට අවම වශයෙන් 100,000 කට නොඅඩු ප්‍රමාණයක් අවස්ථා 04 කදී සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි 28 දිනට පෙර 1,200,000 ක් වූ අන්නාසි මොරෙයියන් සැපයුම සම්පූර්ණ කළ යුතු වුවත්, ඊට පටහැනිව වරකට ඉතා අඩු ප්‍රමාණයන්ගෙන් අවස්ථා 10 කදී සැපයුම් කර තිබුණේ මොරෙයියන් 174,401 ක්වූ ඉතා ස්වල්ප ප්‍රමාණයකි. මේ සම්බන්ධයෙන් සුදුසු පියවර ගෙන නොතිබුණි.

(iv) ගිවිසුම් කාලය හමාරවී තිබුණද සපයා තිබුණු මොරෙයියන් අනුව ගෙවූ අත්තිකාරම් මුදලින් අයකර ගත යුතු රු.3,191,993 ක් අයකරගෙන නොතිබුණි.

(v) ගිවිසුම් කඩ කිරීම සම්බන්ධයෙන් ගිවිසුමේ අංක 10 දරන කොන්දේසිය පරිදි ප්‍රමාද ගාස්තු කොන්ත්‍රාත්කරුගෙන් අය කර ගෙන නොතිබුණි.

(vi) අන්නාසි මොරෙයියන් සපයා නොතිබීම නිසා වගා ස්ථාපිත කටයුතු අතරමග නැවති තිබුණු අතර ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගෙන ව්‍යාපෘති කටයුතු ඉටු කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) බිංගිරිය කැපු විසිතුරු ශාක පත්‍ර සැකසුම් පැළැටි වගා ව්‍යාපෘතිය සඳහා දැල් ගෘහ 100 ක් ඉදිකිරීම රු.12,164,700

කොන්ත්‍රාත්තුව රු.12,164,700 කට ප්‍රදානය කර ගිවිසුම්වලට එළඹීදෑමන් පසු ඉදිකිරීම් පිරිවිතරයන් සංශෝධනය කිරීමට කටයුතු කර තිබුණු නිසා, ගිවිසුම් පරිදි 2010 පෙබරවාරි 28 දින අවසන් කළ යුතුව තිබුණු කොන්ත්‍රාත්තුව, 2011 අපරේල් 30 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. මේ අනුව ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක කිරීමේදී දීර්ඝ කාල ප්‍රමාදයක් සිදුකර තිබුණු බව නිරීක්ෂණය විය.

3.2.8 කාර්ය මණ්ඩල සංයුතිය

මණ්ඩලයේ අනුමත කාර්යමණ්ඩලය 365 දෙනෙක් වූ අතර, තථ්‍ය කාර්ය මණ්ඩලය 252 දෙනෙක් වුයෙන් 2010 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු වූ සංඛ්‍යාව 113 ක් එනම්, අනුමත කාර්ය මණ්ඩලයේ ප්‍රතිශතයක් ලෙස 31% ක් විය.

3.2.9 අයවැය ලේඛනමය පාලනය

2010 වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයට අනුව සංවර්ධන කාර්යයන් සඳහා වූ ඇස්තමේන්තුගත වියදම රු.මිලියන 390 ක් වුවද, වර්ෂය අවසානයට සංවර්ධන කාර්යයන් සඳහා වූ තථ්‍ය වියදම රු.මිලියන 221 ක් වුයෙන් තථ්‍ය වියදම අයවැය ලේඛනගත ප්‍රතිපාදනයෙන් 57% ක් වී තිබුණි. ඒ අනුව ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස අයවැය ලේඛනය උපයෝගී කරගෙන නොතිබුනු බව නිරීක්ෂණය විය.

4. පද්ධති හා පාලන

විගණනයේදි නිරීක්ෂණය වූ අඩුපාඩු පිලිබඳව වරින් වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කල යුතුවේ.

(අ) ස්ථාවර වත්කම් ඉවත් කිරීම්

(ආ) සමාගම්වල කොටස් විෂයෙහි කල ආයෝජන හා ඒවාට ලාභාංශ ලබා ගැනීම

(ඇ) අපනයනකරුවන්ට ලබා දී තිබූ ණය ආපසු අයකර ගැනීම

(ඈ) හිඟහිටි ආදායම් අයකර ගැනීම

(ඉ) අරමුදල් උපයෝජනය

(ඊ) උපයෝගී ලේඛන පවත්වා ගැනීම

(උ) අසාමාන්‍ය ගිණුම් ශේෂ නිරවුල් කිරීම

(ඌ) වත්කම් සමීක්ෂණය

(එ) අපනයන ප්‍රවර්ධන වැඩසටහන්වල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, අරමුණු සාක්ෂාත් කර ගැනීම පිලිබඳ සමාලෝචනය හා පසු විපරම් කටයුතු

(ඒ) ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්කගත අරමුණු සාක්ෂාත් කර ගැනීම

එච්.ඒ.එස්.සමරවීර

විගණකාධිපති.